වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව - 2024



දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර



කාර්යාලය:

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

නව නගරය- රත්නපුර .

දූ.ක: 045 2222235

ෆැක්ස්: 045 2222140

ඊ-මේල්: moha.distratnapura@gmail.com

ශීර්ෂය 278

අන්තර්ගතය

පරිච්ඡේදය	පිටුව

දිස්ත්‍රික් ලේකම්ගේ පණිවිඩය

01. වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ **4**

02. වන පරිච්ඡේදය - ප්‍රගතිය සහ ඉදිරි දැක්ම **13**

03. වන පරිච්ඡේදය - සමස්ත මූල්‍ය කාර්ය සාධනය **48**

04. වන පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක **86**

05. වන පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය **87**

06. වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 88

07. වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව **90**

වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව- 2024

දිස්ත්‍රික් ලේකම් / දිසාපතිතුමාගේ පණිවුඩය



රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2024 වර්ෂයේදී ළඟාකරගත් කාර්ය සාධනය විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කරමින් "වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව - 2024 " මෙසේ ඔබ වෙත පිළිගන්වමි.

"යහපාලනය තුළින් සමෘද්ධිය" දැක්ම කරගත් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් දිස්ත්‍රික්කයේ ජීවත්වන මිලියන 1.2 ක් පමණ වන ජනකාවගේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා මෙන්ම විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් ව්‍යවස්ථාපිත ආයතනවල සහභාගීත්වයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ 2,527ක් පමණ වන කාර්ය මණ්ඩලය මනා ලෙස කළමනාකරණය කිරීමේ පැවරුණු වගකීම නිසි පරිදි සිදු කිරීමට හැකි වී ඇතැයි මා විශ්වාස කරමි.දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක මූලික වගකීම වන්නේ දිස්ත්‍රික්කය තුළ තිරසාර සංවර්ධනය ඇති කිරීම උදෙසා දිස්ත්‍රික්කයේ සියළුම ආයතන සඳහා රාජ්‍ය මට්ටමින් නායකත්වය හා මඟපෙන්වීම ලබා දීමත්, දිස්ත්‍රික්කය තුළ පීඩාවට පත් ජන කොටස් සඳහා වැඩසටහන් ප්‍රමුඛතාගත කිරීමත්ය.

2030 වසර වනවිට තිරසාර ආර්ථිකයක් සඳහා පදනම සකස් කරමින් සමස්ත රාජ්‍ය ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමේ විශේෂිත ක්‍රියාවලිය යටතේ, ආර්ථික අර්බුදය හමුවේ දැඩි බලපෑමකට ලක්ව ඇති ජන ජීවිතය යථාවත් කිරීම සඳහා බිම් මට්ටමේ දායකත්වය අප විසින් සැපයීම කළ යුතුව ඇත. ඒ සඳහා රජයේ ප්‍රවේශයන් වෙත යාමේදී ආයතනික පාලනය/භෞතික පාලනය/ යහපාලනය සහ නවීන ක්‍රමෝපායන් තුළ "සමස්ත - සමාජයේ" ඉදිරි ප්‍රවේශයන් සඳහා සමාගම්, සිවිල් සමාජ සංවිධාන සහ පුද්ගලයන් රාජ්‍ය අංශය සමඟ ඒකාබද්ධව මෙහෙයවීම අවශ්‍ය වේ. එහිදී, හුදෙක් ස්වකීය ආයතනයෙන් ඔබ්බට ගොස් සමස්ත ආර්ථිකයේ පරාමිතීන් තුළ ජන ජීවිතය ගොඩනැඟීම සඳහා සෞඛ්‍ය සේවය,සමාජ සේවා , අධ්‍යාපන,කෘෂිකර්මය,ප්‍රවාහන, ග්‍රාමීය සංවර්ධන හා පළාත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා භාණ්ඩාගාරයෙන් වෙන් වන ඒකාබද්ධ අරමුදල් මනා කළමනාකාරිත්වයක් හා මනා මූල්‍ය කළමනාකරණයන් තුළින්, උපරිම පහසුකම් සහිතව සංවර්ධන වැඩසටහන් ක්ෂේත්‍ර ගණනාවක් සඳහා කාර්යක්ෂමව හා ඵලදායීව හැසිරවීමට හැකියාව ලැබී ඇත.

අවසන් වශයෙන්, 2024 වර්ෂයේ මෙම ප්‍රගතිය අත්පත් කර ගැනීම සඳහා මූලිකත්වය දුන් එවකට මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම් ලෙස කටයුතු කළ වසන්ත ගුණරත්න මහතාටත්, කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීමේදී ඒ වෙනුවෙන් දායක වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනෙකුත් සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ආයතනවේදීව සිහිපත් කරන අතර ඒ සඳහා ලැබුණු සහාය ඉතා අගය කොට සළකමි.

.....

කේ.ජී.එස්. නිශාන්ත
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය.

කේ.ජී.එස්. නිශාන්ත
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
රත්නපුර.

1 - පරිච්ඡේදය

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය

භූගෝලීය පිහිටීම

වර්ග කිලෝමීටර් 3275.4 ක විශාලත්වයකින් යුතු මෙම දිස්ත්‍රික්කය ලංකාවේ 06 වන විශාලතම දිස්ත්‍රික්කය වේ. දිස්ත්‍රික්කයේ නිරපේක්ෂ පිහිටීම සැලකීමේ දී උතුරු අක්ෂාංශ 6.230 - 6.930 හා නැගෙනහිර දේශාංශ 80.170 – 80.950 අතර පිහිටා ඇත. සාපේක්ෂ පිහිටීමට අනුව උතුරින් කෑගල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්ක වලින් ද දකුණින් ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක වලින් ද බස්නාහිරින් කොළඹ හා කළුතර දිස්ත්‍රික්ක වලින් ද නැගෙනහිරින් මොණරාගල හා බදුල්ල දිස්ත්‍රික්ක වලින් ද සීමා වන රත්නපුර දිස්ත්‍රික්කය දිවයිනේ වැඩිම දිස්ත්‍රික්ක ගණනකින් මායිම් වන දිස්ත්‍රික්කයයි. භූ විෂමතාවය සැලකීමේදී දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශ මුහුදු මට්ටමේ සිට මීටර් 50 කටත් වඩා උන්නතාංශය අඩු වන අතර දිස්ත්‍රික්කයේ මධ්‍ය පෙදෙසින් මීටර් 400 ක් පමණ උන්නතාංශයකින් යුක්ත වේ. නවද බටහිර මායිම මීටර් 700 ක් පමණ ද, නිරිත දිග මායිම මීටර් 1300 ක් පමණ ද, උතුරු පෙදෙසින් මීටර් 2500 ක් පමණ දක්වා ද උන්නතාංශය වෙනස් වේ. 2023 වර්ෂයේ සංඛ්‍යා ලේඛන තොරතුරු අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 1,187,672 ක් වේ. එයින් ස්ත්‍රී ජනගහනය 602,135 ක් වන අතර පුරුෂ ජනගහනය 585,537 කි. පවුල් ඒකක ගණන 342,027 කි. දිස්ත්‍රික්කයේ ජන ඝනත්වය සැලකීමේදී එය වර්ග කිලෝමීටරයට 363 කි.

2023 වර්ෂය වන විට රත්නපුර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 1,187,672 කි. ජන සංයුතිය අනුව බහුතරයක් සිංහල ජනයා වන අතර දෙමළ , මුස්ලිම් , බර්ගර් සහ මැලේ වැනි ජන වර්ගයන්ගෙන් යුක්ත වේ. ආගම් අනුව සලකා බැලීමේදී බෞද්ධ ජනයා බහුතරය වන අතර හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි සහ රෝමානු කතෝලික වැනි භක්තිකයන්ද ජීවත් වේ. මානව පරිනාමය දක්වා විහිදුණු ඉතිහාසයක් හා වැදගත්කමක් සහිත රත්නපුර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකාවේ පවතින සියළුම දේශගුණික තත්වයන් විවිධ ප්‍රාදේශීය කළාප තුළින් පෙන්වයි. ඇඹිලිපිටිය,කල්තොට,කොලොන්න වැනි ප්‍රදේශ වියළි හා ශුෂ්ක බවත් , බලන්ගොඩ, බෙලිහුල් ඔය ,එරත්න, පලාබද්දල ශීත දේශගුණික තත්වයත්, අවිස්සාවේල්ල,ඇහැළියගොඩ සිංහරාජ වනාන්තරය, වැනි ප්‍රදේශ තවත් දේශගුණික වටපිටාවකත් පිහිටයි. දිස්ත්‍රික්කයේ වැඩි කොටසක් කළු ගඟේ ගංවතුර තැනිතලාවේ පිහිටා ඇත. ඒ අනුව, සාමාන්‍යයෙන් මැයි මාසය තුළ එය නිරන්තර ගංවතුරට මුහුණපායි. ජල ගැලීම් පාලනය කිරීම සඳහා කළු ගඟේ ඉහළට මහා පරිමාණ වේලි නොමැති අතර නගරයේ ගංවතුර අවදානම අවම කිරීමේ යෝජනා තවමත් අවසන් අදියරට පැමිණ නැත.

මූලික වශයෙන් කෘෂිකාර්මික ආර්ථික පරිසරයකින් යුක්ත රත්නපුර දිස්ත්‍රික්කයේ සේවා නියුක්ත ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් කෘෂිකාර්මික අංශයේ සේවාවල නියුක්ත වේ. එය සේවා නියුක්ත ජනගහනයෙන් 41.6% ක ප්‍රතිශතයකි.කර්මාන්ත සහ සේවා අංශය සලකන විට එය පිළිවෙලින් 29.2% ක් හා 29.2% ක ප්‍රතිශතයක අගයක් ගනියි. දිස්ත්‍රික්කයේ විරැකියා අනුපාතය 3.9 % කි. කිසියම් විශේෂිත දැනුමක් හෝ පුහුණුවක් අවශ්‍ය නොවන රැකියාවල එනම් මූලික රැකියාවල 28.4% වැනි වැඩි ප්‍රතිශතයක් සේවා නියුක්තව සිටියි. කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතු පවත්වාගෙන යන එනම් කර්මාන්ත , වෙළඳ සේවා කටයුතු පවත්වාගෙන යනු ලබන ඒකක 45,210 ක් දිස්ත්‍රික්කය තුළ පවතී. එම ආයතනවලින් වෙළඳාම පවත්වාගෙන යනු ලබන ආයතන වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර එය සංඛ්‍යාත්මකව 16,965 කි. කර්මාන්ත අංශයේ නියැළි ආයතන අඩු සංඛ්‍යාවක් වාර්තා වේ. එය 11,216 කි. නවද ආර්ථික වශයෙන් වැඩි වටිනාකමක් උසුලන මැණික්, දිස්ත්‍රික්කයේ වැඩියෙන්ම පැතිරුණු ඛණිජ වර්ගය වන අතර පුහුණු සහ නුපුහුණු ලෙස මැණික් කර්මාන්තයේ යෙදෙන බොහෝ පිරිසක් දිස්ත්‍රික්කයේ වෙසෙයි.

දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම හා එහි වැදගත්කම

දැනට සොයාගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව පැරණිතම මිනිසා, එනම් බලංගොඩ මානවයා පිළිබඳ පාෂාණභූත ඇටසැකිලි සොයාගෙන ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේ බට දොඹලෙන හා බෙල්ලන්බැඳිපැලැස්ස වැනි ස්ථානවලිනි. අනුරාධපුර යුගයේ ඇතැම් ස්ථානවලින් ලැබුණු බ්‍රාහ්මීය අක්ෂර ගණයට වැටෙන අක්ෂරවලින් යුතු සෙල්ලිපි ඉහත ප්‍රදේශයෙන්ද සොයාගෙන ඇති අතර, ඇඹිලිපිටිය,

කල්තොට ප්‍රදේශලින්ද ලැබී ඇති අනිකුත් නටඹුන් වලින් ද රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති ඓතිහාසික වටිනාකම පැහැදිලි වේ. රත්නපුර දිස්ත්‍රික් කොඩිය කසාවන් මුතුපාට කොඩියකි. සබරගමුවේ පුරාණ කොඩියෙන් සකස් කර ගන්නා ලද මෙහි විසිතුරු රතු දාරයක් ද කසාවන් පසු තලයක්ද ඇත්තේය. කසා වර්ණය මහ සමන් දිව්‍ය රාජයාණන්ට කැපකරන ලද වර්ණය වේ.

දිස්ත්‍රික්කයේ ඇති ප්‍රධාන පූජනීය ස්ථානය ශ්‍රී පාදස්ථානය වේ. අවුරුද්දේ උදුවප් පොහොය දිනෙන් ඇරඹෙන ශ්‍රී පාද වන්දනා සමය ඊළඟ වසරේ වෙසක් පුර පසළොස්වක පොහොය දක්වා පවතී. දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම විශාල පිරිසක් මේ කාලය තුළ වන්දනාව සඳහා මෙම ස්ථානයට පැමිණෙති. රත්නපුර මහ සමන් දේවාලය ද එවැනි ඓතිහාසික වටිනාකමක් ඇති තවත් වැදගත් පූජනීය ස්ථානයකි. එකී වාර්ෂික ඇසල පෙරහැර මංගල්‍යය සබරගමුව මහා සංස්කෘතික සංදර්ශනය ලෙස හැඳින්විය හැකිය. මේ හැරුණු විට දෙල්ගමුව රජමහා විහාරය, පොත්ගුල් විහාරය, අළුත්නුවර දේවාලය හා සංඛපාල රජ මහා විහාරය වැනි ආගමික අතින් වැදගත් ස්ථාන රාශියක් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.ඓතිහාසික වශයෙන් මෙන්ම ආගමික හා සංස්කෘතික සහ පාරිසරික වශයෙන් වටිනාකමක් ඇති ආකර්ෂණීය මෙන්ම සුප්‍රසිද්ධ ස්ථාන දිස්ත්‍රික්කය පුරා විහිදී පැවතීම සංචාරක වටිනාකමක් එකතු කිරීමට සමත්ව ඇත. සිංහරාජ වනාන්තරය, උඩවලව ඇත් අතුරු සෙවන, වවුල්පන හිරිගල් ගුහාව, බෝපත් ඇල්ල වැනි දර්ශනීය දිය ඇලි යනාදියෙන් පාරිසරික වටිනාකමක් මෙන්ම සංචාරක ප්‍රදේශයක් වීමට බලපා ඇත.

දේශගුණික සහ පාරිසරික ලක්ෂණ

දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 240C ත් 350C ත් අතර මට්ටමක පවතී. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 3749.3 කි. එසේ වුව ද දිස්ත්‍රික්කයේ පිහිටීම අනුව දිවයිනේ දැකිය හැකි සියලු දේශගුණික කලාපවලට අයත් ලක්ෂණ දැකිය හැකිය. මෙරට උපරිම වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශවලින්ද සැලකිය යුතු ප්‍රමාණයක් රත්නපුර දිස්ත්‍රික්කයට අයත්ය. මැයි සිට සැප්තැම්බර් දක්වා නිරිත දිග මෝසමෙන් දිස්ත්‍රික්කයේ තෙත් කලාපයට අයත් ප්‍රදේශවලට අධික වර්ෂාපතනයක් ලැබෙන අතර එම කාල සීමාව තුළදී මෙම ප්‍රදේශ ගංවතුර තර්ජනයට ලක්වේ. විශේෂයෙන්ම 2017 වසරේදී විශාල වශයෙන් ගංවතුර සහ නායයාම් ආදී ආපදා සිදු වූ අතර එම වසරේ දී මැයි මාසයේ දී පමණක් මි.මී. 1000කට ආසන්න වර්ෂාපතනයක් ලැබී ඇත. නොවැම්බර් සිට පෙබරවාරි මාසය දක්වා වූ ඊසාන දිග මෝසම් සුළඟින් ඇඹිලිපිටිය, කල්තොට වැනි වියළි කලාපය ලෙස ගැනෙන ප්‍රදේශවලට වර්ෂාව ලැබේ. සමනල කඳු ආශ්‍රිත ප්‍රදේශවලදී ඉතා අඩු උෂ්ණත්වයකුත් වියළි කලාපීය ප්‍රදේශවලදී ඉහළ උෂ්ණත්වයකුත් පෙන්වන මෙම දිස්ත්‍රික්කය තුළ දැඩි උෂ්ණත්ව විවලතාවක් ද පෙන්නුම් කරයි. පරිපාලනමය වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18 කින් සමන්විත රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව 575 කි. පළාත් පාලන ආයතන අනුව මහ නගරසභාවක්, නගර සභා 02 ක් සහ ප්‍රාදේශීය සභා 14 ක් ඇත. තවද මැතිවරණ කොට්ඨාස 08කින් සමන්විත වන අතර නියෝජනය වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගණන 11කි. මීට අමතරව දිස්ත්‍රික්කය නියෝජනය කරනු ලබන පළාත් සභා මන්ත්‍රී ආසන ගණන 22 කි.දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යය වන්නේ දිස්ත්‍රික්කයේ රාජ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීමයි. ඒහිදී පළාත් සභාව සමඟ සෘජු සම්බන්ධීකරණයක් පවත්වාගෙන යමින් එක් එක් අංශ වෙත ලැබෙන ප්‍රතිපාදන මගින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඵලදායී ලෙස ඉහළ නැංවීමට ක්‍රියා කිරීම සිදුකරනුලබයි.

1.2 ආයතනයේ දැක්ම / මෙහෙවර / අරමුණ :

දැක්ම

"යහපාලනය තුළින් සමෘද්ධිය"

මෙහෙවර

ප්‍රාදේශීය ලේකම් කාර්යාල, අනෙකුත් රජයේ ආයතන, පුද්ගලික අංශය හා රාජ්‍ය නොවන අංශය ද ක්‍රියාකාරී ලෙස සහභාගී කර ගනිමින් රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම

අරමුණු

දිස්ත්‍රික්කය තුළ සියලුම රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය ආයතනය ලෙස ක්‍රියාකරමින් ඒ ඒ දෙපාර්තමේන්තු වල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටුවන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම

3. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

1. රජයේ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.
2. ගම් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන් හා සංවිධාන මාර්ගයෙන් නීතියෙන් පවරා දී ඇති කාර්යයන් සාධනය කිරීම
3. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම
4. විවිධ ශීර්ෂයන්ට අදාළ ආදායම් එකතු කිරීම
5. විමධ්‍යගත අයවැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
6. පළාත් සභාවට ඒවායේ කටයුතුවලදී සහාය වීම
7. ජාතික මට්ටමේ සහ දිස්ත්‍රික් මට්ටමේ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධාන ආයතනය ලෙස ක්‍රියාකිරීම.
8. සියලුම මැතිවරණ කටයුතු වලදී මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජිත ආයතනය ලෙස ක්‍රියාකිරීම.
9. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, කෘෂිකර්ම කමිටුව, පරිසර කමිටුව, පෝෂණ කමිටුව, ඩෙංගු මර්ධන කමිටුව, නිවාස කමිටුව යන කමිටු පැවැත්වීම මගින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
10. දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක සහ ග්‍රාම නිලධාරි කාර්යාල 575 ක පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම.
11. විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් රැස් කිරීම, ගිණුම් ගත කිරීම, භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හා අදාළ ආදායම් ගණන් දීමේ නිලධාරීන් දැනුවත් කිරීම.
12. දිස්ත්‍රික්කය තුළ සියලුම රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වල නියෝජිත ආයතනය ලෙස ක්‍රියාකරමින් ඒ ඒ දෙපාර්තමේන්තු වල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.
13. නියඟ,ගංවතුර, සුළි සුළං, නාය යෑම් , නියඟය වැනි විස්තීර්ණ ස්වාභාවික ආපදා අවස්ථාවන්හිදී රජයේ නියෝජිතයා ලෙස ක්‍රියාකරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය හා පසු විපරම් කටයුතු කිරීම හා ස්ථාවර කිරීම.
14. දිස්ත්‍රික්කය තුළ ඉඩම් ඔප්පු ලියාපදිංචි කිරීමත්, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ ඡායා පිටපත් නිකුත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
15. දිස්ත්‍රික්කය තුළ විශ්‍රාම වැටුප් වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
16. මහජන දුක්ගැනවිලි සඳහා ඵලදායී ප්‍රතිචාරාත්මක ආයතනයක් ලෙස කටයුතු කිරීම.
17. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනතේ විධි විධාන ක්‍රියාත්මක වන පොදු අධිකාරියක් ලෙස ක්‍රියාකිරීම

රත්නපුර දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස


අනු අංකය	මැතිවරණ කොට්ඨාසය	ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය
1	රත්නපුර	රත්නපුර, කුරුවිට
2	ඇහැලියගොඩ	ඇහැලියගොඩ, කිරිඇල්ල
3	කලවාන	කලවාන, අයගම
4	බලංගොඩ	බලංගොඩ,ඉඹුල්පේ
5	පැල්මඩුල්ල	පැල්මඩුල්ල, රත්නපුරෙන් කොටසක්
6	රක්වාන	ඕපනායක, ගොඩකවෙල, වැලිගෙපොල
7	නිවිතිගල	නිවිතිගල, ඇලපාත, කහවත්ත
8	කොලොන්න	කොලොන්න, ඇඹිලිපිටිය


1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අංශ :

1	ලේකම් අංශය/අති.ලේකම් දිස්ත්‍රික් අංශය	
2	ආයතන අංශය	
3	ගිණුම් අංශය	
4	දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අංශය	
5	අභ්‍යන්තර විගණන අංශය	
6	ඉංජිනේරු අංශය	
7	සමෘද්ධි අංශය	
8	දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය	
9	සංඛ්‍යා ලේඛන අංශය	
10	විමර්ශන අංශය	
11	ක්ෂේත්‍ර නිලධාරී අංශය	
I	සංස්කෘතික කටයුතු	
II	සමාජ සේවා කටයුතු	
III	බෞද්ධ කටයුතු	
IV	දිස්ත්‍රික් ඵලදායිතා කටයුතු	
V	ක්‍රීඩා කටයුතු	
VI	ළමා සංවර්ධන කටයුතු (ළමා හිමිකම් /	
VII	මනෝ සමාජීය/ළමාආරක්ෂක/මුල් ළමාවිය	
VIII	රාජ්‍ය නොවන සංවිධාන කටයුතු	
IX	අන්තරායකර ඖෂධ පාලන කටයුතු	
X	භාෂා පරිවර්ථන කටයුතු	
XI	කාන්තා කටයුතු	
XII	මානව සම්පත් සංවර්ධන කටයුතු	
XIII	විදේශ රැකියා කටයුතු	
XIV	දිස්ත්‍රික් විද්‍යාත්මක කටයුතු	
12	ආපදා කළමනාකරණ අංශය/ආපදා සහන සේවා අංශය	
13	ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශය	
14	මෝටර් රථ ප්‍රවාහන දිස්ත්‍රික් කාර්යාලය	
15	දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය	
16	ජාතික ළමාරක්ෂක අධිකාරිය	
17	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	
18	කාර්මික සංවර්ධන මණ්ඩලය	
19	සමාජ ආරක්ෂණ මණ්ඩලය	
20	කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය	
21	මිණුම් ඒකක හා ප්‍රමිත සේවාඅංශය	
22	මාධ්‍ය අංශය	
23	දිස්ත්‍රික් බහුකාර්ය සංවර්ධන අංශය	
24	ප්‍රාදේශීය පරිපාලනය	

රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ රටාව - 2024		
ඉඩම් භාවිත ප්‍රදේශයේ ස්වභාවය	(හෙක්ටයාර)	ප්‍රතිශතය (%)
ඉදිකිරීම් භූමිය	7,399.50	2.26
ගෙවතු/නිවස	60,472.40	18.46
තේ	47,261.13	14.43
රබර්	35,054.40	10.7
පොල්	7,434.51	2.27
වී	17,535.67	5.35
මිශ්‍ර බෝග සහ අනෙකුත් බහු වාර්ෂික පලතුරු	9,969.92	3.04
ක්ෂේත්‍ර භෝග	8,214.60	2.51
වෙනත් භෝග	6,690.07	2.04
අත්හරින ලද වී	2,166.30	0.66
අත්හරින ලද රබර්	349.95	0.11
අත්හරින ලද තේ	265.48	0.08
ඝන වනාන්තර	59,228.55	18.09
විවෘත වනාන්තර	18,049.76	5.51
පත්‍ර	25,828.30	7.89
තෘණබිම් (තැනිතලා, සැවානා	5,411.71	1.65
රිදී වගාව	4,804.44	1.47
තෙත්බිම්	68.46	0.02
ජල මතුපිට (වැව/ජලාශය/ගංගාව/ඇළ දොළ/වාරිමාර්ග)	47.3	0.01
පාෂාණ	6,286.39	1.92
පර්වත	3,656.53	1.12
නිසරු ඉඩම්	1,304.66	0.4

1.4 ආයතනික ව්‍යුහය - සංවිධාන සටහන




සිතියම් අංක 01: සාපේක්ෂ සහ නිරපේක්ෂ පිහිටීම
රත්නපුර දිස්ත්‍රික්කය
කොළඹ
කෑගල්ල
නුවරඑළිය
බදුල්ල
මොණරාගල
කළුතර
ගාල්ල
මාතර
හම්බන්තොට
N
0 5 10 20 කි.මී.
සිතියම් අංකය
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
1 ඇහැළියගොඩ
2 කුරුවිට
3 කිරිඇල්ල
4 රත්නපුර
5 ඉඹුල්පේ
6 බලංගොඩ
7 කල්තොට
8 ඕපනායක
9 පැල්මඩුල්ල
10 ඇලපාත
11 අයගම
12 කලවාන
13 නිවිතිගල
14 කහවත්ත
15 ගොඩකවෙල
16 වැලිගෙපොල
17 ඇඹිලිපිටිය
18 කොළොන්න
සුචිය
දිස්ත්‍රික් මායිම
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම
ප්‍රා. ලේ. කාර්යාලවල පිහිටීම

- **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී වසම්**

අනු අංකය	ප්‍රා.ලේ.කොට්ඨාශ අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව	ගම් සංඛ්‍යාව	ග්‍රාම නිලධාරී වසම් ගණන
1	**9103**	ඇහැලියගොඩ	18	96	44
2	**9106**	කුරුවිට	26	85	39
3	**9109**	කිරිඇල්ල	14	35	17
4	**9112**	රත්නපුර	22	160	53
5	**9115**	ඉඹුල්පේ	13	252	50
6	**9118**	බලංගොඩ	6	206	41
7	**9121**	ඕපනායක	21	119	20
8	**9124**	පැල්මඩුල්ල	21	111	37
9	**9127**	ඇලපාත	10	68	20
10	**9130**	අයගම	10	67	21
11	**9133**	කලවාන	14	125	33
12	**9136**	නිවිතිගල	9	82	24
13	**9139**	කහවත්ත	16	54	21
14	**9142**	ගොඩකවෙල	10	62	44
15	**9145**	වැලිගෙපොල	8	138	30
16	**9148**	ඇඹිලිපිටිය	17	107	40
17	**9151**	කොලොන්න	10	123	29
18		කල්තොට	4	53	12
එකතුව			**249**	**1943**	**575**

- **ඉඩම් බලපත්‍ර හා ඔප්පු ලබාදීම**

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	මුළු බිම් ප්‍රමාණය (හෙක්/අක්/කිමී)	නිකුත් කරන ලද ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව	නිකුත් කරන ලද ඔප්පු ප්‍රමාණය	නිකුත් කරන ලද ඔප්පු පිටපත් සංඛ්‍යාව
1	අයගම	හෙක් 16500	114	114	25
2	බලංගොඩ	අක්.68881	22	14	18
3	ඇඹිලිපිටිය	හෙක්11160	37	35	0
4	ඇහැලියගොඩ	හෙක්14100	1	4	131
5	ඇලපාත	හෙක්1546.11	24	6	0
6	ගොඩකවෙල	හෙක්.2534	19	0	1
7	ඉඹුල්පේ	හෙක්.25,600	65	65	46
8	කහවත්ත	හෙක්10199	2	2	8
9	කලවාන	අක් .15.27	24	8	0
10	කල්තොට	අක්.18601.2	32	32	10
11	කිරිඇල්ල	හෙක්1647.41	9	4	23
12	කොලොන්න	හෙක්6737.0645	191	191	0
13	කුරුවිට	හෙක්17449.41	0	0	0
14	නිවිතිගල	හෙක’21.8592	6	0	0
15	ඕපනායක	හෙක් 7464	10	10	74
16	පැල්මඩුල්ල	අක්.6032	52	52	26
17	රත්නපුර	චර්ග කි.මී.329.41	170	170	0
18	වැලිගෙපොල	හෙක්20209.99	25	26	67
	එකතුව		**796**	**725**	**428**

- **වර්ෂය තුළ ලබාදුන් ජාතික හැඳුනුම් පත් හා ග්‍රාම නිලධාරි සහතික හා උපත් /විවාහ/මරණ ලියාපදිංචි කිරීම්**

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ජාතික හැඳුණුම්පත් සංඛ්‍යාව	ග්‍රාම නිලධාරි සහතික සංඛ්‍යාව	ලියා පදිංචි උපත් සංඛ්‍යාව	නිකුත් කල උප්පැන්න සහතික පිටපත් සංඛ්‍යාව	ලියාපදිංචි කරන ලද විවාහ සංඛ්‍යාව	නිකුත් කරන ලද විවාහ සහතික පිටපත් සංඛ්‍යාව	ලියාපදිංචි කරන ලද මරණ සංඛ්‍යාව	නිකුත් කරන ලද මරණ සහතික පිටපත් සංඛ්‍යාව
1	අයගම	851	3264	0	4640	107	612	149	402
2	බලංගොඩ	1915	12200	03	22021	406	2363	324	716
3	ඇඹිලිපිටිය	7393	4656	2108	43411	900	3737	1514	1061
4	ඇහැලියගොඩ	3798	9095	04	27728	445	2726	487	1133
5	ඇලපාත	1010	3523	0	7599	221	827	151	580
6	ගොඩකවෙල	2163	12510	7	17851	474	1634	433	507
7	ඉඹුල්පේ	1682	9215	1582	14100	327	1125	678	2050
8	කහවත්ත	2078	5562	1200	17980	356	1554	581	828
9	කලවාන	2188	4069	20	8878	276	805	267	521
10	කල්තොට	513	1000	2	3130	80	367	55	153
11	කිරිඇල්ල	1184	3550	2	5947	145	774	139	470
12	කොලොන්න	1427	6482	12	10891	259	1215	285	517
13	කුරුවිට	3196	10200	01	16500	722	2122	428	945
14	නිවිතිගල	1472	6324	04	8443	239	548	298	285
15	ඕපනායක	1008	3166	0	6018	155	684	127	313
16	පැල්මඩුල්ල	2963	9850	00	17830	451	2260	373	901
17	රත්නපුර	6685	17100	4384	58756	695	5662	2596	5175
18	වැලිගෙපොල	953	3862	2	4443	141	683	142	294
	එකතුව	**42479**	**125628**	**9331**	**296166**	**6399**	**29698**	**9027**	**16851**

1.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ආයතන /අරමුදල් - අදාළ නැත

1.7 විදේශීය අරමුදල් සැපයෙන ව්‍යාපෘති වල විස්තර - අදාළ නැත

02 - පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම {විශේෂ ජයග්‍රහණ/අභියෝග/ඉලක්ක}

සමස්ත ආර්ථිකයේ 2030 වර්ෂයේදී ලභාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු මත පදනම්ව, 2024 අයවැය වර්ෂය සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලැබූ ප්‍රතිපත්ති සම්පාදනය තුළ එකී වර්ෂය ලබා ගත් කාර්යසාධනයේ ප්‍රගති සමාලෝචණය මෙම පරිච්ඡේදයෙන් විවරණය කරනු ලබයි.

ඒ අනුව, දිස්ත්‍රික්කයේ සියළුම සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සම්බන්ධයෙන් මාසික ප්‍රගති සමාලෝචනයක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් මඟින් සිදු කරනු ලබයි.එහිදී දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රජාවන් සඳහා වන ආර්ථික ,සාමාජයීය, ජීවනොපාය වැඩසටහන් පිළිබඳව සාකච්ඡා වන අතර ප්‍රාග්ධනය, දැනුම, ණය පහසුකම් සහ මගපෙන්වීම් ,ගැටළු, දේශගුණික තත්වයන් මත සිදුවන ආපදා හා සමාජ කඩා වැටීම්, ගොඩනැගීම් , පිළිබඳව සුවිශේෂී අවධානයක් මෙන්ම ආයතනික වශයෙන් පරිපාලනමය ගැටළුද ඉලක්ක ගත වේ.

2024 වර්ෂය මැතිවරණ වර්ෂයක් විය. එහිදී විවිධ අභියෝගයන් යටතේ ක්‍රියාත්මක වීමට සිදු වූ අතර දේශගුණික වශයෙන් ජලගැලීම් - නායයෑම් හා වගා පාළු වූ ආපදා සහිත වර්ෂයක්ද විය. එහිදී , විශේෂයෙන් දිස්ත්‍රික්කයේ ඉඩම් නිරවුල් කිරීම්, වන්දි ලබා දීම් හා ජාතික ආපදා සම්හන්ධයෙන් දිස්ත්‍රික් පරිපාලනය ක්‍රියාකිරීම්, ප්‍රාදේශීය පරිපාලනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ සහ ක්‍රියාත්මක කිරීම් මෙන්ම දැඩි මූල්‍ය පාලන ක්‍රමවේදයන් ද මඟින් තිරසර අරමුණු සාක්ෂාත් කර ගැනීමට සිදුවිය. ඒ අනුව 2024 වසර තිරසර අරමුණු ලභාකර ගැනීමේ පසුගාමී වර්ෂයක් ලෙස ද හැඳින්විය හැක.එහෙත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින සැලසුම් අංශය,කුඩා කර්මාන්ත අංශය,ඉඩම් අංශය,බෞද්ධ කටයුතු අංශය වැනි වෙනත් දෙපාර්තමේන්තු,ව්‍යවස්ථාපිත නොවන ආයතන , රාජ්‍ය නොවන ආයතන හා පළාත් සභාවේ සහභාගිත්වයෙන් ග්‍රාමීය මට්ටමේ ප්‍රජා සංවර්ධ කටයුතු සිදුකර ගැනීමට හැකිව ඇත.

2:1 විශේෂ ජයග්‍රහණ

01. මානව සම්පත් හා ප්‍රජා සංවර්ධනය

- දිස්ත්‍රික් මෙන්ම ප්‍රාදේශීය මට්ටමින් සමාරම්භක උත්සව ,ආගමික උත්සව හා ජාතික උත්සව පැවැත්වීම
- අස්වැසුම් සුභසාධන ප්‍රතිලාභී පවුල් සවිබල ගැන්වීමේ උපාය මාර්ගික වැඩසටහන්
- ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන වැඩසටහන්
- තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම් හා තරුණ ප්‍රජාව ව්‍යවසායකත්වය තුලින් සවිබල ගැන්වීම
- පුහුණු වැඩසටහන් හා ඒකාබද්ධ පරිසර නියමු වැඩසටහන්

02. ආර්ථික සංවර්ධනය හා සවිබල ගැන්වීම්

දිස්ත්‍රික් සැලසුම් අංශය මඟින් ක්‍රියාත්මක විශේෂිත වැඩසටහන් ප්‍රගතිය

අනු අංකය	වැඩසටහන	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)
1	විමධ්‍යගත අයවැය වැඩසටහන	92
2	කඳුකර දශකය 2024 - 2033	85
3	ග්‍රාමීය මාර්ග වැඩසටහන	100
4	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන	100
5	ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධන වැඩසටහන	100
6	පිරිවෙන් සංවර්ධන වැඩසටහන	100
7	පිරිවෙන් සංවර්ධන වැඩසටහන (ඩෙස් පුටු ලබා දීම)	100
8	වතු යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන	100
9	මුස්ලිම් පල්ලි සංවර්ධන වැඩසටහන	85
10	පාසල් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන	100
11	පාසල් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන(පැති විකට් ඉදිකිරීම)	100
12	කිතුල් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන	100
13	විදුලි වැට ඉදිකිරීමේ වැඩසටහන	25

01. කඳුකර දශකය



1. දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - (2024 – 33) ප්‍රමුඛ කොට 2024 වර්ෂයේ රත්නපුර දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටු තීරණ මත සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කර ඇත. ලොව දරිද්‍රතාව පිටුදැකීමේ බහුමානික දරිද්‍රතා දර්ශකය'' සමගාමීව ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් ඔස්සේ ප්‍රාදේශීය විෂමතා අවම කිරීම මඟින් තිරසර සංවර්ධනය, කඳුකර ප්‍රදේශ ආශ්‍රිත කලාපයේ පොදු යටිතල පහසුකම් හා සේවාවන්ගේ මෙන්ම ජනතාවගේ උසස් ජීවන මට්ටම උදෙසා පාරිසරික සාධක මත බලපෑමට ලක්වන සම්පත් බෙදාහැරීම ක්‍රමිකව සිදු කිරීම අරඹයා ක්‍රියාත්මක වන අතර එය SME -DCB වැඩසටහන් හා සමගාමී වේ. එහිදී නිරන්තරයෙන් අත්විඳින ආපදා ප්‍රදේශ සඳහා ප්‍රමුඛත්වය දෙමින් ක්‍රියාත්මක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සුළු අපනයන හා සුළු පරිමාණ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආවරණය කරනු ලබයි.

රත්නපුර දිස්ත්‍රික්කයේ - ප්‍රා.ලේ.කොා. 14 - මහනගර සභා - 02 - රු.මිලියන1,400 ක් මෙම ව්‍යාපෘතිය සඳහා යොදවා ඇති අතර මූල්‍ය ප්‍රගතිය රු.මිලියන.1060.49 ක් වේ.වැඩ අවසන් ව්‍යාපෘති ගණන 1515 කි.

2. විමධ්‍යගත අයවැය වැඩසටහන



විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ නිම කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ගණන 2,538 ක් වූ අතර වැඩ අවසන් ව්‍යාපෘති ගණන 2,334 කි. ඒ සඳහා අනුමත ප්‍රතිපාදනය වන රු.මිලියන 622.66 කින් වියදම 535.78 කි.

3. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන



අඩුආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමත්, නිෂ්පාදන දිරිගැන්වීමත් ,අපනයන නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා දේශීය පරිභෝජන අවශ්‍යතා ඉටුකිරීම ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක සමෘද්ධි නිෂ්පාදන ගම්මාන හා සෞභාග්‍යා පොකුරු ගම්මාන වැඩසටහන එකී ගම්මානවල පවතින සංවර්ධන ක්‍රියාවලිය තව දුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂිතයි.
සෞභාග්‍යා ගෙවතු වගා වැඩසටහන යටතේ රත්නපුර ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් වෙත කහ පැල ලබාදීම , රන් කර්මාන්ත කරුවන් දිරි ගැන්වීම ,සෞඛ්‍ය ආරක්ෂිත එළවළු, පළතුරු නිෂ්පාදනය ,වැනි ගොවින්ගේ ආදායම් මට්ටම ඉහල නැන්වීමට බලාපොරොත්තු වේ. නව ව්‍යාපෘතිය යටතේ දැනට සිදු කරන ගෘහාශ්‍රිත තක්කාලි වගාව, කෙසෙල් වගාව, ආදියට අමතරව ඉඟුරු හා කහ වගාවට ගොවින් දිරිගැන්වීම සිදු වේ.

- ජාතික නිෂ්පාදනය වැඩිකිරීම.
- විකල්ප ආදායම් මාර්ග ඇති කිරීම.
- විරැකියාව අඩු කිරීම.
- දේශීය නිෂ්පාදන ප්‍රචලිත කිරීම.

කෘෂි මාර්ග සංවර්ධනය, කෘෂි වතුර පොම්ප ලබාදීම, විදුලි සම්බන්ධතා ලබා දීම, හා පුහුණු වැඩ සටහන් පැවැත්වීම ආදී නව ප්‍රවණතා රාශියක් මෙම නිශ්පාදන ගම්මාන තුල ඇති කිරීමට නියමිතයි.

4. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන




ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ වැඩ අවසන් ව්‍යාපෘති ගණන 129කි. ඒ සඳහා අනුමත ප්‍රතිපාදනය රු.මිලියන 143 ක් වන අතර වියදම රු.මිලියන 137 කි. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන සඳහා රුපියල් මිලියන 260 ක්ද හේවාහින්න, ඉද්දමල්ගොඩ, මෝරගල, අස්ගගුල, මාහර, වලදුර, පාතගම, කිතුල්පේ, ඉහලතෙප්පනාව,වතුයාය, එක්නැලිගොඩ, සුදාගල, උතුරුගිලි මලේ යන ග්‍රාම නිළධාරී වසම්වල තෝරාගත් මාර්ග මෙලෙස සංවර්ධනය කෙරේ.

5. කිතුල් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන



කිතුල් නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ අයගම, කොළොන්න සහ කලවාන,... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07 ක රු.මිලියන 1.142 ක වියදමින් සිටුවන ලද පැල සංඛ්‍යාව 3067 කි. එහි භෞතික ප්‍රගතිය 100% වේ.ප්‍රෙද්ශීය ලේකම් කොට්ඨාශ 17 න් 03 ක් තෝරාගෙන 2003-2004 වර්ෂවල සිට මෙම කර්මාන්තය සංවර්ධනය සඳහා රජය විසින් යටිතල පහසුකම් සපයා ඇත. නව තාක්ෂණ දැනුම ලබා දීම, වෙළෙඳ පොළක් ඇති කිරීම, සමාජ ආකල්ප වර්ධනය කිරීම යන ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු කර ඇත. වාණිජමය වගාවක් ලෙසට කිතුල් ව්‍යාප්ත කිරීමට උසස් පලදායිතාවක් ඇති නව කිතුල් ප්‍රභේද හඳුන්වා දීමටත්, කිතුල් පැළ 3067 ක් පමණ නොමිලයේ බෙදා දීමට හැකි වුණා. කිතුල් හකුරු අපනයනට යොමු වීම මෙහි මුඛ්‍ය පරමාර්තය වේ.

1. යටිතල පහසුකම් සඳහා වියදම් - දි.ලේ.කාර්යාලය ප්‍රගතිය



02. ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය ශූන්‍ය (ZERO) කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම (ZERO PLASTIC WASTE) හා ඉතා අවධානම් මට්ටමේ පසුවන පුද්ගලයන් සඳහා මුදල් ආධාර ලබා දීමේ (SAVE THE CHILDREN) වැඩසටහන

එනම් රත්නපුර දිස්ත්‍රික්කය Zero Plastic waste ආදර්ශමත් දිස්ත්‍රික්කයක් බවට පත් කිරීමේ වැඩසටහන යටතේ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය හා ප්ලාස්ටික් මඟින් සිදුවන පරිසර විනාශය පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනයි. දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18 හිම ග්‍රාම නිලධාරී විසින් පළමු අදියර ලෙස ඇහැලියගොඩ, රත්නපුර, කුරුවිට, කිරිඇල්ල හා ඇලපාත යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ආර්ථික සංවර්ධන නිලධාරීන් හා වැවිලි ප්‍රජා සවිබල ගැන්වීමේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන මෙහිදී මධ්‍යම පරිසර අධිකාරිය හා Gro Recyling Hub ආයතනයේ අනුග්‍රහයකත්වයෙන් කුරුවිට ගැමුණු හේවා සේනාංක මූලස්ථානය වෙත කසල බහාලුම් ප්‍රධානය කිරීමක් ද සිදු කෙරිණි. වසම් 575 ම ආවරණය වන පරිදි වසම් භාර ආර්ථික සංවර්ධන නිලධාරීන් හා වැවිලි ප්‍රජා සවිබල ගැන්වීමේ නිලධාරීන් දැනුවත් කර ඒ හරහා දිස්ත්‍රික්කයේ මහජනතාව දැනුවත් කිරීමට කටයුතු සැලසුම් කර ඇතරත්නපුර දිස්ත්‍රික්කයට පසුගිය දිනවල බලපෑ විවිධ ආපදා තත්ත්වයන් සමඟ අපවිත්‍ර වූ නගර, උපනගර හා මංමාවත් පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන් මාලාවක් රත්නපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ස්ථානවලදී සාර්ථකව පැවැත්විණි.මෙම ශ්‍රමදාන වැඩසටහන් මාලාව සබරගමුව පළාත් සභාව, රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා පොලිසිය, රත්නපුර මහ නගර සභාව ඇතුළු රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන එක්ව සංවිධානය කරන ලදී.විශේෂයෙන් ගං වතුර බැසයාමත් සමඟ ඇතිවිය හැකි ඩෙංගු, මී උණ හා පාචනය වැනි රෝග බෝවීම වලක්වා ගැනීම මෙන්ම ගං වතුරට ගලා ආ පොලිතීන් හා ප්ලාස්ටික් නිසිපරිදි ඉවත්කර පරිසරය සුවපත් කිරීම මෙන්ම වායු දූෂණය පාලනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය. මෙහි සම්පත්දායකත්වය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී එන්.බී. ගාමිණී මහතා මෙන්ම මධ්‍යම පරිසර අධිකාරිය, CEYLON EMERALD WAY (PVT) LTD ආයතනය, මනුසත් බලකාය විසින් ලබා දෙන ලදී.

3. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්

සමෘද්ධි අංශය මඟින් ක්‍රියාත්මක වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	ප්‍රගතිය (%)
1	සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන	100%
2	සමාජ සංවර්ධන වැඩසටහන	100%
3	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන හා අලෙවි සංවර්ධන වැඩසටහන	100%
4	සමෘද්ධි බැංකු වැඩසටහන	100%
5	ප්‍රජාමූල වැඩසටහන	100%
6	සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන	100%
7	සමාජ සංවර්ධන වැඩසටහන	100%
8	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන හා අලෙවි සංවර්ධන වැඩසටහන	100%
9	සමෘද්ධි බැංකු වැඩසටහන	100%

ඉහත ව්‍යාපෘති වලට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධනය පහත ක්ෂේත්‍ර ඔස්සේ සිදු කෙරේ.කාබනික පොහොර නිෂ්පාදනය -ඇන්තූරියම් සහ විසිතුරු මල් වගාව-බිම්මල් වගාව ප්‍රවර්ධනය කිරීම-පොදු යටිතල පහසුකම් සංවර්ධනය-පානීය ජලය ලබා දීම-පරිසර හා තිරසර සංවර්ධනය(ජල උල්පත් ආරක්ෂා කිරීම හා රක්ෂිත ප්‍රදේශයේ වන වගාව ආරම්භ කිරීම)-සේවා පියස ඉදිවන ස්ථානයෙහි පොදු ඉදිකිරීම් -විහාරස්ථාන සංවර්ධනය කිරීම-කුරුදු ,ගම්මිරිස්,කහ සහ පොල් වැනි පැළ ලබාදීම-සත්ත්ව පාලන ව්‍යාපෘතිය (ගවයින් කුකුලන් සහ එළුවන් පාලනය) අතුරු මාර්ග සංවර්ධනය කිරීම -තෝරා ගත් ප්‍රතිලාභීන් සඳහා රියදුරු පුහුණුව ලබා දීම-පෙදරේරු සහ වඩු කාර්මිකයින් නගා සිටුවීම සඳහා උපකරණ ලබා දීම-ඇඟළුම් කර්මාන්තය නගා සිටුවීම (ඇදුම් මැසීමේ කර්මාන්තයට අවශ්‍ය උපකරණ ලබාදීම)-ස්වයංරැකියා ප්‍රවර්ධනය (වඩු වැඩ, මේසන් වැඩ, වෙල්ඩින්, ඇළුමිනියම්, ඇඟළුම්) ගෘහාශ්‍රිත වෙළඳ ඒකක පිහිටුවීම -සංවර්ධන -පෙර පාසල් සංවර්ධනය හා ගුරුවරුන් පුහුණු කිරීම

4. සමාජ සුභසාධන වැඩසටහන්

අස්වැසුම ගෙවීම - ලාංකික ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමේ අරමුණින් බැංකු ගිණුම් වෙත ප්‍රතිලාභී මුදල් මුදා හැරීමෙන්, නෝට්ටු භාවිතයෙන් ඔබ්බට ගිය විනිවිදභාවයෙන් යුතු දේශපාලණයෙන් තොරවූ බැංකු පද්ධතියක් හා බැඳුණු ග්‍රාමීය ආර්ථික සංවර්ධනයක් මෙමඟින් බලාපොරොත්තු වේ.සමාජ ආරක්ෂණය වඩාත්ම ඇවැසි සුදුසු පුද්ගලයා වෙත සෘජුව ප්‍රතිලාභ ලබාදීමට හැකි වීම මෙහි ඇති විශේෂත්වයකි.දරිද්‍රතාවේ අවධානමට ලක්විය හැකි ප්‍රජාව සවිබල ගැන්වීමේ සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීමේ මහඟු අවස්ථාවක් ලෙසටද මෙය හඳුන්වා දිය හැක

වර්ෂය	අස්වැසුම ප්‍රතිලාභය සඳහා ලබාදුන් මුදල (රු)	අස්වැසුම ප්‍රතිලාභීන් ගණන
2023	4,860,965,500.00	113,690
2024	10,958,792,000.00	143,238

<u>අස්වැසුම හා සමෘද්ධි අඩු ආදායම්ලාභීන් පවුල් සවිබල ගැන්වීම</u>

- අභියෝග අවම කිරීමට නිලධාරීන් දැනුවත් කර අභිප්‍රේරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ප්‍රතිලාභී පවුල් 19ක් සඳහා ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රාග්ධන උපකරණ ලබාදීම
- ආදර්ශ ගම්මාන වැඩසටහනට අදාළව මැණික් කැපීමේ යන්ත්‍ර 06 ක් අස්වැසුම ප්‍රතිලාභීන්ට ලබාදීම
- වතු කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම
- විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන්ගේ ආර්ථිකය, පවුල් සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන්
- දැඩි ආර්ථික ගැටළු සහිත කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම්
- ව්‍යවසායක කාන්තාවන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපල හඳුන්වා දීම, සබඳතා ගොඩ නැගීම, නව නිෂ්පාදන හඳුන්වා දීම
- චක්‍රීයව සිදුවන ණය වැඩසටහන් සඳහා යොමුවන කාන්තාවන් සඳහා අවශ්‍ය දැනුම ලබා දීම
- ADB ව්‍යාපෘතිය යටතේ තෝරාගත් කාන්තාවන් සඳහා ප්‍රතිලාභ ලබා දීම
- කාන්තාවන් මානසික වශයෙන් ශක්තිමත් කිරීම සඳහා උපදේශන ලබාදීම

- **ආබාධිත පුද්ගල සවිබල ගැන්වීම**

අනු අංකය	වැඩසටහන	වියදම (රු.මිලියන)	ප්‍රතිලාභීන් ගණන
1	ජීවනාධාර ව්‍යාපෘතිය	547.48	7,518
2	සෘජු ව්‍යාපෘති ආධාර	61,584.00	3
3	වකුගඩු රෝගී ජීවනාධාර	130.44	1,721
4	ආබාධිත පුද්ගලයින් සඳහා උපකරණ ලබා දීම	-	2
	එකතුව	**62,261.92**	**9,244**

- **වැඩිහිටි පුද්ගලයින් නගා සිටුවීම**

අනු අංකය	වැඩසටහන	වියදම(රු.මිලියන)	ප්‍රතිලාභීන් ගණන
01	ජීවනාධාර ව්‍යාපෘතිය	1,067.82	23368
එකතුව		**1,067.82**	**23,368**

- **ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ සුභ සාධන වැඩසටහන් ප්‍රගතිය**

අනු අංකය	වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව
1	අබාධ සහිත පුද්ගල විශේෂ ව්‍යාපෘති	1
2	වැඩිහිටි පුද්ගලයින් සඳහා ශ්‍රවණ උපකරණ ලබා දීම	3
3	සී.බී.ආර්. වැඩසටහන	**2**
4	වැඩිහිටි බල මණ්ඩල පැවැත්වීම	3
5	ස්වශක්ති සංවිධාන වැඩසටහන	4
6	වැඩිහිටි සමිති බල ගැන්වීම	45
7	අවම පහසුකම් සැපයීමේ වැඩසටහන	15
8	ස්වයං රැකියා ආධාර වැඩසටහන	32
9	ආරෝග්‍යා මූල්‍යාධාර වැඩසටහන	115
එකතුව		220

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක වෙනත් වැඩසටහන්

ප්‍රා. ලේකම් කාර්යාල	ඉඩම් කච්චේරි පැවැත්වීම/ ජංගම සේවා	වක්‍රීය ණය අරමුදල	මාර්ග ප්‍රතිසංස්කරණ	වන වගාව	පානීය ජලය	සනීපාරක්ෂක සේවා	නිවාස ආධාර
අයගම	7	4	13	0	0	0	4
බලන්ගොඩ	17	0	0				
ඇඹිලිපිටිය	16	5783m	0		820m	6	59
ඇහැළියගොඩ	19	0	0	0	0	0	0
ඇලපාත	4	0	0				
ඉඹුල්පෙ	3	76	98		1		
කහවත්ත	1	22	0				
කළවාන	17	1	0		1		
කිරිඇල්ල	0	0	0				
කොලොන්න	6	34	10				
කුරුවිට	0	0	109		12	99	
නිවිතිගල	22	6	100		40		
ඕපනායක	10	14	100			18	
පැල්මඩුල්ල	2	8					16
රත්නපුර	,09/16	4			100		
එකතුව	**124**	**169**	**430**	**0**	**154**	**123**	**79**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ආංශික කාර්යය සාධනය

ආයතන අංශය - මානව සම්පත් කළමනාකරණය

- ප්‍රතිපත්ති සම්පාදන කටයුතු
- දිස්ත්‍රික් පරිපාලන ගැටළු විසඳීම - ප්‍රාදේශීය පරිපාලනය සහ අධීක්ෂණය වැඩිදියුණු කිරීම

අනු අංකය	කාරණය	වැඩ සටහන	ප්‍රගතිය/ක්‍රියාමාර්ග
01	මහජනතාවගේ ඉල්ලීම් / දුක්ගැනවිලි/ ලිපි සම්බන්ධයෙන් ගත් කඩිනම් ක්‍රියාමාර්ග	මහජන පැමිණිලි-108	අවසන් කල පැමිණිලි-80
02	2024 වර්ෂයේ ඉඩම් ගැටළු	ඉදිරිපත් ල කල ඉඩම් ගැටළු- 285	අවසන් කලප්‍රමාණය -213
02	වර්ෂයේ විගණන වාර්තා	විගණනය-36	අවසන්-36
03	රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී සාකච්ඡාවූ මෙතෙක් නොවිසඳුනු කරුණු	දැක්ම හා මෙහෙවර	ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට පොදු දැක්මක් සකස් කිරීම
		සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම	ගොඩකවෙල/ඉඹුල්පෙ /වැලිගෙපොල/කොලොන්න සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා ක්‍රියාමාර්ග ගතයුතුව ඇත.

ගිණුම් අංශය

විශ්‍රාම වැටුප් ගෙවීම -2024

අනු අංකය	ප්‍රා.ලේ.	විශ්‍රාමිකයින් ගණන	ලබා දුන් ප්‍රතිපාදනය(රු.)	2023.12.31 දිනට වියදම (රු.)
1	කොලොන්න	856	364,353.50	364,353.50
2	කහවත්ත	629	349,330.60	349,330.60
3	කිරිඇල්ල	752	146,700.00	146,700.00
4	රත්නපුර	3712	812,313.24	812,313.24
5	පැල්මඩුල්ල	1782	645,668.85	645,668.85
6	ගොඩකවෙල	1870	733,330.00	733,330.00
7	නිවිතිගල	750	283,840.00	283,840.00
8	අයගම	490	44,400.00	44,400.00
9	බලංගොඩ	1953	1,134,878.82	1,134,878.82
10	ඇහැළියගොඩ	2050	1,283,431.15	1,283,431.15
11	කුරුවිට	2644	691,800.00	691,800.00
12	ඉඹුල්පෙ	1508	770,881.00	770,881.00
13	ඕපනායක	559	887,648.38	887,648.38
14	වැලිගෙපොල	574	437,580.00	437,580.00
15	ඇලපාත	861	585,695.30	585,695.30
16	ඇඹිලිපිටිය	3046	827,700.00	827,700.00
17	කලවාන	870	894,836.07	894,836.07
18	කල්තොට	226	129,315.00	129,315.00
එකතුව		**25132**	**11,023,701.91**	**11,023,701.91**

- **2024.12.31 දිනට හිඟ බිල්පත් (අතැති බිල්පත්)**

විස්තර	වැය විෂයය කාණ්ඩය	වැය විෂයය	2024.12.31 (මිලියන) වන විට හිඟ බිල්පත්					(7) තීරුවේ (ඔව්/නැත) සඳහන් පරිදි හිඟ බිල්පත් කැපවීමේ අදියරේදී ප්‍රතිපාදන තිබේද යන්න	2022.12.31 දිනට 2022 අයවැය යටතේ පවතින ඉතිරි ප්‍රතිපාදන මුදල	2023 අයවැය යටතේ ලබා ගත හැකි ප්‍රතිපාදන මුදල
			මාසයකට අඩු	මාස 1-2 අතර	මාස 2-3 අතර	මාස 3 කට වඩා	එකතුව (3)+ (4)+ (5)+ (6) =			
1	2		3	4	5	6	7	8	9	10
අත්තිකාම්			-	-	-	-	-			-
පුනරාවර්තන	278 - වෙනත්	278-1-1-0-1409	0.28	-	-	-	**0.28**	ඔව්		0.28
	278 - වැටුප් සහ වැටුප්	278-1-2-0-1001	0.03	-	-	-	**0.03**	ඔව්		0.03
	278 - තැපැල් සහ සන්නිවේදනය	278-1-2-0-1402	0.01	-	-	-	**0.01**	ඔව්		0.01
	278 - වාහන නඩත්තු	278-1-2-0-1301	0.3	-	-	-	**0.3**	ඔව්		0.3
	278 - ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	278-1-2-0-1201	0.04	-	-	-	**0.04**	ඔව්		0.04
	103 - ගමන් වියදම්	103-2-18-0-1101	0.03	-	-	-	**0.03**	ඔව්		0.03
	110 - ගමන් වියදම්	110-1-5-0-1101	0.01	-	-	-	**0.01**	ඔව්		0.01
	126 - විදුලිය සහ ජලය	126-2-22-0-1403	0	-	-	-	**0**	ඔව්		0
	30 - ගමන් වියදම්	130-1-17-0-1101	0.04	-	-	-	**0.04**	ඔව්		0.04
	171 - ගැබිනි මව් දීමනා	171-2-8-1-1501	0.3	-	-	-	**0.3**	ඔව්		0.3
	206- දොළොස්මහේ පහන	206-2-3-6-1409	0.01	-	-	-	**0.01**	ඔව්		0.01
	216- ගමන් වියදම්	216-2-2-0-1101	0.01	-	-	-	**0.01**	ඔව්		0.01
	328 - ගමන් වියදම්	328-1-1-0-1101	0.01	-	-	-	**0.01**	ඔව්		0.01
	334 - දීමනා	334-1-1-0-1003	0.81	-	-	-	**0.81**	ඔව්		0.81
	334 - ගමන් වියදම්	334-1-1-0-1101	0.01	-	-	-	**0.01**	ඔව්		0.93
මූළු පුනරාවර්තන			1.89	-	-	-	**1.89**			**1.89**
	103 - නැවත පදිංචි කිරීම	103-2-18-05-2202	0.93	-	-	-	**0.93**	ඔව්		
ප්‍රාග්ධන	110 - ප්‍රාග්ධන වැඩසටහන්	110-1- 4- 5- 2202	0.07	-	-	-	**0.07**	ඔව්		0.07
	118 - කෘෂිකර්ම කමිටුව	118-2-3-20-2202	0.01	-	-	-	**0.01**	ඔව්		0.01
	149 - ප්‍රාග්ධන වැඩසටහන්	149-2-3-2-2506	4.41	-	-	-	**4.41**	ඔව්		4.41
	252- විනෝදාස්වාද වියදම්	252-1-1-8-2507	0.54	-	-	-	**0.54**	ඔව්		0.54
මූළු ප්‍රාග්ධන			**5.95**	**-**	**-**	**-**	**5.95**			**5.95**
තැන්පතු			**0.13**	**-**	**-**	**-**	**0.13**			**0.13**
මූළු එකතුව			**7.98**	**-**	**-**	**-**	**7.98**			**7.98**

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන සැලැස්ම - 2024

දෙපාර්තමේන්තු/රේඛීය නිලධාරීන්ගේ නියෝජ්‍යයතනය/අංශය	අනු අංකය	ප්‍රසම්පාදන වර්ගය (භාණ්ඩ, වැඩ හා සේවා ආදිය)	ඇස්තමේන්තුගත සිරිවැය (රු.මි. 2024)	මූල්‍ය යෙදවුම් ප්‍රභවය	ප්‍රසම්පාදන ක්‍රමය	අධිකාරී මට්ටම	ප්‍රසම්පාදන කටයුත්ත හදිසි-U ප්‍රමුඛතා - P සාමාන්‍ය	පූර්ව ප්‍රසම්පාදන සූදානම් සහ සිදුවිය යුතු ක්‍රියාකාරකම් වල ප්‍රමාදයන කක්ෂ්‍යය	ආරම්භ කිරීමට නියමිත දිනය	අවසාන කිරීමට නියමිත දිනය	මෙහෙයුම් කරුණු
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	1	ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	7,600,000.00	දෙශීය අරමුදල්	වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය (shopping)	දෙපාර්. ප්‍ර. ක.	P	අවශ්‍යතාවය අනුව ක්‍රියාත්මක කරනු ලැබේ.	2024.01.01	2024.12.31	
	2	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	20,000,000.00				P	අවශ්‍යතාවය අනුව ක්‍රියාත්මක කරනු ලැබේ.	2024.01.01	2024.12.31	
	3	යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	5,000,000.00				P	අවශ්‍යතාවය අනුව ක්‍රියාත්මක කරනු ලැබේ.	2024.01.01	2024.12.31	
	4	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	15,000,000.00				P	අවශ්‍යතාවය අනුව ක්‍රියාත්මක කරනු ලැබේ.	2024.01.01	2024.12.31	
ප්‍රාදේශීය ලේකම් කාර්යාල අළුත්වැඩියාව											
අයගම	1	ආදායම් බලපත්‍ර කවුළුව සඳහා පියස්සක් ඉදිකිරීම	300,000.00	දිස්ත්‍රික් ලේකම් කාර්යාල මූල්‍ය ප්‍රතිපාදන	අනුමත සමිති (සමිති ඇගයුම් කමිටුව)	ප්‍රා. ප්‍ර. ක.	**P**	ඇස්තමේන්තු සකස් කර අනුමැතිය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.	ඇස්තමේන්තු අනුමත වී දින 14 ක් ඇතුළත	ගිවිසුම් ගත වී මාස 03ක් ඇතුළත	–
	2	ආයතන අංශයේ පරිගණක කාමරයේ විදුලිය සපයන පද්ධතිය අළුත්වැඩියා කිරීම හා විදුලි පේණු සවි කිරීම.	130,000.00				**U**				
	3	කාර්යාලයේ ලේඛනාගාරය සඳහා පිටතින් ජල සැපයමක් ලබා ගැනීම.	150,000.00				**U**				
	4	පරිපාලන ග්‍රාම නිලධාරී සඳහා ග්‍රාම නිළධාරී කාමරය තුළ කොටසක වෙන් කිරීම.	150,000.00				**N**				
බළන්ගොඩ	5	කාර්යාලයේ සහාකාර ප්‍රාදේශීය ලේකම් නිල කාමරය හා සහකාර අධ්‍යක්ෂ නිල කාමරය අලුත්වැඩියා කිරීම.	244,496.70	දෙශීය අරමුදල්	ප්‍රජා පාදක සමිති හරහා	ප්‍රා. ප්‍ර. ක.	**P**	සමිති ඇගයීම් කටයුතු ආරම්භ කර ඇත.	2023.03.15	2023.03.20	
	6	ලේඛනාගාරයේ රාක්ක ගැසීම.	79,714.80	දෙශීය අරමුදල්	ප්‍රජා පාදක සමිති හරහා	ප්‍රා. ප්‍ර. ක.	**P**	2023.02.22 වන දින ප්‍රජා පාදක සමිති වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.			
	7	ගිණුම් අංශයේ ලිපිගොණු සඳහා රාක්ක ගැසීම.	319,925.15	දෙශීය අරමුදල්	ප්‍රජා පාදක සමිති හරහා	ප්‍රා. ප්‍ර. ක.	**P**	සමිති ඇගයීම් කටයුතු ආරම්භ කර ඇත.	2023.03.15	2023.03.20	
ඇලපාත	10	කාර්යාලයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ තලාදයක් තුළින් වැසි ජලය කාන්දුවීම අළුත්වැඩියා කිරීම.	51,985.69	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	අනුමත සමිති මගින්	ප්‍රා. ප්‍ර. ක.	**N**	-	2023.03.02	2023.03.31	
	11	කාර්යාල ගොඩනැගිල්ලේ EXHAUST FAN සපයා සවිකිරීම	306,330.22	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්	ප්‍රා. ප්‍ර. ක.	**P**	ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.	-	-	

ගොඩකවෙල	12	කාර්යාලයේ දැව බලපත්‍ර නිකුත් කරන ස්ථානයේ ට්‍රාන්ස්පේරන්සි වහලයක් ඉදිකිරීම.	344,804.28	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ලංසු කැඳවීම	ප්‍රා. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකසා ඇත	ප්‍රතිපාදන ලද වහාම	වැඩ ආරම්භ කර මාසයක් තුලදී	
	13	සමාජ සේවා අංශයට පිවිසෙන මාර්ගයේ වහලය සැකසීම.	300,224.41	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ලංසු කැඳවීම	ප්‍රා. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකසා ඇත	ප්‍රතිපාදන ලද වහාම	වැඩ ආරම්භ කර මාසයක් තුලදී	
ඉඹුල්පෙ	14	කාර්යාලයේ ඉදිරිපස වහලය අලුත්වැඩියා කිරීම.	578,548.54	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකසා ඇත	ප්‍රතිපාදන ලද වහාම	-	
	15	කාර්යාලීය දුරකථන පද්ධතිය අලුත්වැඩියා කිරීම.	250,000.00	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකසා ඇත	ප්‍රතිපාදන ලද වහාම	-	
කහවත්ත	16	කාර්යාලයේ ප්‍රධාන ලේඛනාගාරයේ විදුලි පද්ධතිය නිසි පරිදි සකස් කිරීම.	55,000.00	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකසා ඇත	20/04/2023	21/06/2023	
	17	ඉහළ මහළ අබලන් වී ඇති පිටත සිවිලිම අළුත්වැඩියා කිරීම.	45,000.00	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	P	ඇස්තමේන්තු සකසා ඇත	10/7/2023	19/10/2023	
	18	ගබඩා අංශය වහලය පීලි හා සතුන් අතුල් නොවන පරිදි සකස් කිරීම.	60,000.00	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකසා ඇත	25/04/2023	22/06/2023	
	19	ඉහත ස්ථාන වල විදුලි සම්බන්ධතාවය නිසි පරිදි සකස් කර අළුත්වැඩියා කිරීම.	40,000.00	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකසා ඇත	27/04/2023	26/06/2023	
	20	සහකාර ප්‍රාදේශීය ලේකම් නිල කාමරය වෙන් කර ඇති කොටස් අළුත්වැඩියා තත්ත්වයේ පවතින බැවින් එම කොටස අළුත්වැඩියා කිරීම.	45,000.00	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	N	ඇස්තමේන්තු සකසා ඇත	5/10/2023	19/12/2023	
	21	කාර්යාලයේ ප්‍රධාන ගේට්ටුව අළුත්වැඩියා කිරීම.	50,000.00	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	P	ඇස්තමේන්තු සකසා ඇත	18/07/2023	23/10/2023	
	22	සමෘද්ධි මහා සංගමයට ඇතුළු වන දොර සකස් කිරීම.(Allumunium Sliding Door)	73,422.00	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	N	ඇස්තමේන්තු සකසා ඇත	11/10/2023	28/12/2023	
කලවාන	23	මාණ්ඩලික නිලධාරී වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම.	150,000.00	ඒකාබද්ධ අරමුදල	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	P	යෝජනාවට දිස්ත්‍රික් ලේකම් අනුමැතිය ලැබී ඇති අතර, ඇස්තමේන්තුව දිස්ත්‍රික් ලේකම් අනුමැතියට යැවීමට ඇත.	5/1/2023	30/11/2023	
	24	සමාජ සේවා අංශය පුළුල් කිරීම.	300,000.00	ඒකාබද්ධ අරමුදල	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	P	වෙන්කර ඇති මුදල ප්‍රමාණවත් නොවන බැවින්, ලේඛනාගාරයේ රාක්ක ගැසීම සිදුකිරීමට නියමිතය.	5/1/2023	30/11/2023	

	25	ප්‍රාදේශීය ලේකම් නිල නිවසේ ඉදිරිපස වැසි ආවරණය ඉදිකිරීම.	400,000.00	ඒකාබද්ධ අරමුදල	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	P	අනුමැති ලැබී ඇති අතර, ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර ඇත.	5/1/2023	30/11/2023	
කිරිඇල්ල	26	වැසි ජල කාණු පද්ධතියේ නඩත්තු කටයුතු සිදු කිරීම.	100,000.00	මධ්‍යම රජය	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකස් කර දිස්ත්‍රික් ලේකම් අනුමැතියට ඉදිරිපත් කර ඇත.	ඇස්තමේන්තු අනුමැතිය ලද පසු	අනුමත වූ දින සිට මාස 03ක් ඇතුලත	
	27	සමාජ සුභසාධන අංශයේ සහ ඉඩම් අංශයේ විදුලි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.	150,000.00	මධ්‍යම රජය	සෘජු කොන්ත්‍රාත්	ප්‍රා. ප්‍ර. ක.	P	ඇස්තමේන්තු සකස් කර දිස්ත්‍රික් ලේකම් අනුමැතියට ඉදිරිපත් කර ඇත.	ඇස්තමේන්තු අනුමැතිය ලද පසු	අනුමත වූ දින සිට මාස 03ක් ඇතුලත	
කොලොන්න	28	වැසිකිළි අළුත්වැඩියාව	1,069,770.12	ඒකාබද්ධ අරමුදල	සෘජු කොන්ත්‍රාත් ක්‍රමය	ප්‍රා. ප්‍ර. ක.	P	ඇස්තමේන්තු සකස් කර දිස්ත්‍රික් ලේකම් අනුමැතියට ඉදිරිපත් කර ඇත.	ප්‍රතිපාදන ලැබුණු පසු	කඩිනමින්	
කුරුවිට	29	ජලනල පද්ධතිය වැඩිදියුණු කිරීම.	1,100,000.00	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	සෘජු කොන්ත්‍රාත් ක්‍රමය	ප්‍රා. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකස් කර දිස්ත්‍රික් ලේකම් අනුමැතියට ඉදිරිපත් කර ඇත.	ප්‍රතිපාදන ලැබුණු පසු		
නිවිතිගල	30	වැහි පීලි සකස් කිරීම (කාර්යාල ගොඩනැඟිලි පරිශ්‍රයේ)	200,000.00	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	සෘජු කොන්ත්‍රාත් ප්‍රදානය	ප්‍රා. ප්‍ර. ක.	U	පූර්ව ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත	මාර්තු 21	මාර්තු 23	කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත
	31	උප්පැන්න ,මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයට අවශ්‍ය ලේඛනාගාරය කුඩා රැස්වීම් ශාලාවට යාබදව පාට්ෂන් යොදා සකස් කිරීම	107,700.00	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	සෘජු කොන්ත්‍රාත් ප්‍රදානය	ප්‍රා. ප්‍ර. ක.	U	පූර්ව ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත	මාර්තු 22	මාර්තු 25	කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත
	32	පරිපාලන නිලධාරි නිල කාමරය සඳහා දොර සැකසීම	90,000.00	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	-	ප්‍රා. ප්‍ර. ක.	P	-	-	-	ඇස්තමේන්තුව අනුමැතිය සඳහා දි.ලේ.කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.
ඕපනායක	33	ජෙනරේටර් කාමරය සකස් කිරීම.	178,000.00	278	සෘජු කොන්ත්‍රාත් ප්‍රදානය	ප්‍රා. ප්‍ර. ක.	U	අදාළ නැත.	2023 මාර්තු	2023 අප්‍රේල්	ප්‍රතිපාදන ලැබෙන කාලසීමාව අනුව වෙනස් විය හැක.
	34	ලේඛනාගාරය පුළුල් කිරීම	150,000.00	278	සෘජු කොන්ත්‍රාත් ප්‍රදානය	ප්‍රා. ප්‍ර. ක.	U	අදාළ නැත.	2024 මාර්තු	2024 අප්‍රේල්	
පැල්මඩුල්ල	35	සැළසුම් අංශයේ සහ රෙජිස්ට්‍රාර් අංශයේ ජනෙල් සඳහා වැසි ආවරණ සැදීම හා තිරරෙදි යෙදීම.(වැසි ආවරණ පමණක්)	182,370.22	278	ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය	ප්‍රා. ප්‍ර. ක.	P	ඇස්තමේන්තු සකස් කර යොමු කර ඇත.	-	-	-
	36	ඉහල මාලයේ කොටසක් පාට්ෂන් කර වෙන් කිරීම.	263,336.61	278	ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය	ප්‍රා. ප්‍ර. ක.	P	ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවති.	-	-	-


වැලිගෙපොල	37	කාර්යාල ගොඩනැගිල්ලේ වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීම.	1,800,000.00	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	ඍජු කොන්ත්‍රාත් ප්‍රදානය	ප්‍රා. ප්‍ර. ක.	U	ප්‍රතිපාදන හා ඇස්තමේන්තු අනුමත ලද වහාම අනුමත සමිති කැඳවීමට හැකිය.	2023.03.30	2023.10.30	මෙම ඉදිකිරීම් දැනට පවතින, 1971 වර්ෂයේ පමණ ඉදිකරන ලද වැසිකිළි පද්ධතියේ වළවල් වෙනුවට නව වලවල් ඉදිකොට පවතින පද්ධතියට සම්බන්ධ කිරීමක් බැවින්, වර්ෂාව වැනි බාහිර සාධකයන් මත අපේක්ෂිත කාල රාමුව වෙනස් වීමට හැකියාවක් ඇත.
2104 වැය ශීර්ෂය											
දි. ලේ. කා.	1	මහජන වැසිකිළි පද්ධතිය හා රියදුරු වැසිකිළි පද්ධතිය ඉදිකිරීම. (පළමු අදියර)	12,000,000.00	අයවැය ප්‍රතිපාදන වැය ශීර්ෂය 2104	ජාතික තරඟකාරී මිල ක්‍රමය	ප්‍රා. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකස් කරමින් පවති.	2023.06.12	2023.11.12	ප්‍රතිපාදන අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර ඇත.
දි. ලේ. කා.	2	ගරාජය ඉදිකිරීම. (ජල බවුසරය, රජයේ වාහන නවතා තැබීම සඳහා)	13,000,000.00	අයවැය ප්‍රතිපාදන වැය ශීර්ෂය 2104	ජාතික තරඟකාරී මිල ක්‍රමය	ප්‍රා. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකස් කරමින් පවති.	2023.06.12	2023.10.12	
කල්තොට	1	ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම.(පළමු අදියර)	75,000,000.00	අයවැය ප්‍රතිපාදන වැය ශීර්ෂය 2104	ජාතික තරඟකාරී මිල ක්‍රමය	දෙපාර්. ප්‍ර. ක.	U	ඇස්තමේන්තු සකස් කරමින් පවති.	2023.06.12	2023.12.28	ප්‍රතිපාදන අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර ඇත.
ඇඹිලිපිටිය	2	වැසිකිළි පද්ධතිය ඉදිකිරීම. (පළමු අදියර)	6,000,000.00		වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය (shopping)		U		2023.06.12	2023.10.12	
බළන්ගොඩ	3	සමාජ සුභ සාධන අංශය සහිත ගොඩනැගිල්ලේ ඉහල මහල ඉදිකිරීම.	8,000,000.00				U		2023.06.12	2023.10.12	
ඇහැලියගොඩ	4	ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉහල මහල ඉදිකිරීම.	6,000,000.00				U		2023.06.12	2023.10.132	
දි. ලේ. කා. / ප්‍රා. ලේ. කා.	1	භාණ්ඩ මිලදී ගැනීම	1,000,000.00	ශ්‍රී ලංකා රජයේ අරමුදල්	වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය (shopping)	දෙපාර්. ප්‍ර. ක.	P	අවශ්‍යතාවය පරිදි	2023.01.01	2023.12.31	
දි. ලේ. කා. / ප්‍රා. ලේ. කා.	1	යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	1,300,000.00	ශ්‍රී ලංකා රජයේ අරමුදල්	වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය (shopping)	දෙපාර්. ප්‍ර. ක.	P	අවශ්‍යතාවය පරිදි	2023.01.01	2023.12.31	
දි. ලේ. කා. / ප්‍රා. ලේ. කා.	1	ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	5,000,000.00	ශ්‍රී ලංකා රජයේ අරමුදල්	වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය (shopping)	දෙපාර්. ප්‍ර. ක.	P	අවශ්‍යතාවය පරිදි	2023.01.01	2023.12.31	

***** ඉහත ප්‍රසම්පාදන ප්‍රගතිය 2023 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන 99% වියදම් වී ඇති අතර 2024 වර්ෂයේ 2103-2104 වැය විෂයයන්ගේ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරි වී ඇත.එනම් 0% වේ.මේ සඳහා හේතු අවසාන මූල්‍ය වාර්තා ගිණුම් වල සඳහන් වේ.***

ගිණිඅවි හා පුපුරණ ද්‍රව්‍ය අංශය

අනු අංකය	විස්තරය	භෞතික	මූල්‍ය (රු.)
	පුපුරණ ද්‍රව්‍ය		
1	පුපුරණ ද්‍රව්‍ය භාවිතය සඳහා අවසර පත් නිකුත් කිරීම	300	480,500.00
2	පුපුරණ ද්‍රව්‍ය සපයන්නාගේ බලපත් නිකුත් කිරීම	50	124,700 .00
	එකතුව	**350**	**605,200.00**
	ගිණි අවි/ තුවක්කු		
1	2024 වර්ෂය සඳහා ගිණි අවි/තුවක්කු බලපත්‍ර අළුත් කිරීම (ජන.සිට සැප්. දක්වා)	289	31,100.00
2	2025 වර්ෂය සඳහා ගිණි අවි/තුවක්කු බලපත්‍ර අළුත් කිරීම (ඔක්.සිට නොවැ. දක්වා)	635	82,200.00
3	2025 වර්ෂය සඳහා මුරකරු බලපත්‍ර නිකුත් කිරීම	185	1,850.00
4	ගිණි අවි සඳහා නව ඉල්ලීම් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම	50	500.00
5	නව ගිණි අවි සඳහා බලපත් සඳහා අයදුම්පත් නිකුත් කිරීම	18	-
6	ගිණි අවි/ තුවක්කු ආපසු රජයට භාරදීම(2024 වර්ෂය)	**9**	-
	එකතුව	**1186**	**115,650.00**

දිස්ත්‍රික් ඉංජිනේරු අංශය



මෝටර් රථ අංශය

අංකය	විස්තරය	සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය(රු.)
1	නව රියදුරු බලපත් නිකුත් කිරීම	23550	87,821,250.00
2	රියදුරු බලපත් අළුත් කිරීම	10682	58,873,475.00
3	අනන්‍යතා සහතික නිකුත් කිරීම හා බර සහතික නිකුත් කිරීම	269	307,050.00
4	අංක තහඩු නිකුත් කිරීම	4011	-
5	තහනම් නියෝග නිකුත් කිරීම	95	3,000.00
	එකතුව	**38607**	**147,004,775.00**

පාරිභෝගික කටයුතු අංශය

අනු අංකය	ක්‍රියාකාරකම	2024 ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ	වසර අවසාන ප්‍රගතිය (%)	ඉදිරි ඉලක්කය
1	වැටලීම් රාජකාරි	897	99	900
2	නඩු පැවරීම්	547	-	144
3	මිල සමීක්ෂණ	144	100	-
4	සහන පැමිණිලි	33	85	-
5	උසාවි රාජකාරි	0	100	-
6	**දැනුවත් කිරීම්**	33	117	28

ඵලදායිතා අංශය

වැඩසටහන	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	ප්‍රතිලාභීන්
▶ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ඵලදායිතා සවිබල ගැන්වීමේ එක්දින වැඩසටහන	100	54,800.00	60
▶ විගණික ප්‍රජාව ඉලක්ක කරගත් ප්‍රජා ඵලදායිතා එක්දින වැඩසටහන	100	69,150.00	72
එකතුව	**100**	**123,950.00**	**132**

අනු අංකය	ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඉලක්ක	මිණුම් දර්ශකය	ප්‍රගතිය
01	සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත එක් නිලධාරියෙකු විසින් 1 ක් බැගින් තෝරාගෙන ඵලදායිතා සංකල්ප භාවිතයෙන් සවිබල ගැන්වීම - ආයතන 36	සවිබල ගන්වන ලද ආයතන සංඛ්‍යාව / ආයතනික ප්‍රගතිය	100%
02	තෝරාගත් රාජ්‍ය ආයතනවල ක්‍රියාවලි 2ක් තෝරා ගෙන වැඩි දියුණු කිරීම- ආයතන 64	තෝරා ගෙන වැඩි දියුණු කරන ලද ක්‍රියාවලි සංඛ්‍යාව	91%
03	5S සහතිකකරණ වැඩසටහන	5S සහතිකකරණය සඳහා තෝරා ගත් ආයතන සංඛ්‍යාව	34%
04	ඵලදායිතා සහතික පත්‍ර පාඨමාලාව ක්‍රියාත්මක කිරීම. - තෝරාගත් ආයතන ගණන 03	ක්‍රියාත්මක පාඨමාලා සංඛ්‍යාව / සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව	50%
05	ආයතනවල ඉල්ලීම පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (එක් නිලධාරියෙකු විසින් මසකට එක් වැඩසටහන බැගින්)	ඉල්ලීම් අනුව ක්‍රියාත්මක කළ වැඩසටහන් සංඛ්‍යාව	111%
06	ප්‍රජා ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (එක් නිලධාරියෙකු විසින් කාර්තුවකට වැඩසටහන් 02 බැගින්)	ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	116%
07	ආසියානු ඵලදායිතා සංවිධානය මගින් පවත්වන Digital Learning වැඩසටහන් සඳහා සහභාගි වීම (එක් නිලධාරියෙකු විසින් අවම වශයෙන් වසරකට 1ක්)	සහභාගී වූ වැඩසටහන් සංඛ්‍යාව	
08	මාසික ප්‍රගති වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ලබාදීම	යොමු කරන ලද මාසික ප්‍රගති වාර්තා සංඛ්‍යාව	94%
09	ඉදිරි වැඩසටහන් සහ කළ වැඩසටහන් ප්‍රධාන කාර්යාලය වෙත ලබා දීම	යොමු කරන ලද ඉදිරි සහ කළ වැඩසටහන් සංඛ්‍යාව	93%
ජ්‍යෙෂ්ඨ ඵලදායිතා සංවර්ධන නිලධාරීන් හා සම්බන්ධ රාජකාරි ඉටු කිරීම			
10	ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම / ප්‍රගති රැස්වීම් සටහන් සංඛ්‍යාව සහ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබා දීම	රැස්වීම්සංඛ්‍යාව/සටහන් සංඛ්‍යාව සම්පත් දායකත්ව පැය ගණන(92%,92%,128%)	104%
	2024 වර්ෂයේ සමස්ත කාර්ය සාධනය		**90%**

කෘෂිකර්ම අංශය

වැඩසටහන/ ව්‍යාපෘතිය	වැඩසටහන/ ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත ඉලක්කයන්	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය(රු.මි.)
දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් පැවැත්වීම	දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් වාර - 12	දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් වාර - 11	0.06422
ආහාර සුරක්ෂිතතාවය හා තාක්ෂණය වැඩසටහන - ඇලපාත කෘ.උ. කොට්ඨාසය තුළ අමු මිරිස් අවශ්‍යතාවය 50% සම්පූර්ණ කිරීම ව්‍යාපෘතිය	හෙක්ටයාර 1.2 ක අමු මිරිස් වගාව මගින් අවශ්‍යතාවයෙන් 50% සම්පූර්ණ කිරීම	මිරිස් බීජ - ග්‍රෑ. 840, කෘමි ප්‍රතිරෝධී දැල් රෝල් – 24, තවාන් තැටි - 132, රසායනික පොහොර 851.93 Kg, කාබනික පොහොර - 16800 Kg, වළවල් කැපීම සඳහා යන්ත්‍ර - 01, අස්වනු බහාලුම් කූඩ - 54 ක් ගොවීන් 12 අතර 50% පදනමට දී අක්. ¼ බැගින් හෙක්ටයාර 1.2 ක අමු මිරිස් වගාව	0.9761
ආහාර සුරක්ෂිතතාවය හා තාක්ෂණය වැඩසටහන - වගා ආරක්ෂිත දැල් ලබා දීමේ ව්‍යාපෘතිය, ඕපනායක	වගා දැල් 543 ක් ගොවීන් වෙත ලබා දීම හා ක්ෂේත්‍ර ස්ථාපනය	වගා ආරක්ෂිත දැල් 543 ක් ගොවීන් 85 ක් වෙත 50% පදනමට ලබා දීම හා ක්ෂේත්‍ර වල ස්ථාපනය	2.478525
තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන - 2024	තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන 06 ඇති කිරීම තුළින් ව්‍යවසායකයන් බිහිකිරීම	**1. කුරුවිට - ලස්සකන්ද වසම** ආරක්ෂිත ගෘහ තුළ නයිමිරිස් වගාව- ගෘහ 06, කුරුඳු පැළ 5000, ගම්මිරිස් පැළ 60, කෝපි පැළ 50 වගාව, ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීම (ආහාර විජලන යන්ත්‍ර 04 ,පිටි කොටන යන්ත්‍ර 02, මිරිස් කොටන යන්ත්‍ර 03, බෑන්ඩ් සීලර් 01, වැකුම් සීලර්, ආහාර ටින් කිරීමේ යන්ත්‍ර 01), බීම්මල් නිෂ්පාදන ගෘහ 5, රත් කෙසෙල් පැළ 400, වායු රයිෆල් 02, බිත්තර රක්කනයක් හා මී ගවයින් 03, කිතුල් නිෂ්පාදන ප්‍රවර්ධනය (ශීතකරණ 02) - 50% පදනමට ගොවීන් 37	6.037582
දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය	1. නිලධාරි හිඟය - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 2ක් සඳහා නිලධාරින් නොසිටි අතර වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නිලධාරින් විසින් රාජකාරි කටයුතු ආවරණය කිරීම සිදුවිය. 2. තාක්ෂණික උපකරණවල හිඟය	• පස සහ ජල සංරක්ෂණය තුළින් ඌණ පරිහරණ කෘෂිකාර්මික බිම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 වැඩසටහන් 3 • ග්‍රාමීය සහ ක්ෂුද්‍ර ජල පෝෂක ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02වැඩසටහන් 2 • විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් (පාසැල් ශිෂ්‍ය/ප්‍රජාව)ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02වැඩසටහන් 2 • දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු කමිටු 01 • ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු 08ක • ප්‍රගති සමාලෝචන රැස්වීම් -12 • වතු ඉඩම් ආශ්‍රිත භූමි පරිහරණය සිතියම්ගත කිරීමේ වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16 (අයගම, ඇලපාත, ඇහැළියගොඩ, කුරුවිට, රත්නපුර, පැල්මඩුල්ල, කහවත්ත, ගොඩකවෙල, නිවිතිගල, කලවාන, ඉඹුල්පේ, ඕපනායක, කිරිඇල්ල, කොලොන්න, බලංගොඩ, වැලිගෙපොල)වැඩසටහන අවසන් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව • ඉඩම් යෝග්‍යතා පරීක්ෂණ-පරීක්ෂණ 500
කාර්මික සංවර්ධන මණ්ඩලය	1.ව්‍යවසායකයන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට උනන්දුවක් නොමැති වීම 2.පාසැල් ළමුන් බාහිර ක්‍රියාකාරකම් සඳහා යොමු නොවීම	1. ව්‍යවසායකයන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීම 2. හැකිතාක් පාසැල් ළමුන් බාහිර ක්‍රියාකාරකම් සඳහා යොමු කර ගැනීම
මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය		1. නව රියදුරු බලපත් නිකුත් කිරීම-30,000 2. රියදුරු බලපත් අළුත් කිරීම-8,000 3. අනන්‍යතා සහතික නිකුත් කිරීම හා බර සහතික නිකුත් කිරීම250 4. අංක තහඩු නිකුත් කිරීම-5,000 5. තහනම් නියෝග නිකුත් කිරීම-80

ඉංජිනේරු අංශය	1.අධික වැසිතත්වය හමුවේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම 2. කොන්ත්‍රාත්කරුවන්ට අමු ද්‍රව්‍ය හිහතාව	1. අයවැය මඟින් වෙන්වන ප්‍රතිපාදන ඵලදායීව යොදා ගැනීම 6. අමු ද්‍රව්‍ය හිඟතාව අවම කර ගැනීම හා කඩිනම් සේවාව


වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව-2024

	2. කොන්ත්‍රාත්කරුවන්ට අමු ද්‍රව්‍ය හිඟතාව	2. අමු ද්‍රව්‍ය හිඟතාව අවම කර ගැනීම හා කඩිනම් සේවාව
කුඩා ව්‍යාපාර අංශය	1. මැතිවරණ වර්ෂයක් වීම හේතුවෙන් නියමිත දිනට වැඩසටහන් ක්‍රියාත්මනක කිරීමට නොහැකි වීම.	• පවත්නා ව්‍යාපාර සංවර්ධනය 180 • ඒකපුද්ගල නාක්ෂණික පුහුණුව 203 • ඇසුරුම්කරණය 135 • ව්‍යාපාර වෙළඳ ලකුණු (ලෝගෝ)නිර්මාණය 144 • තත්වසහනික(GMP/NVQ/SLS/GAP/Patent 34 • අලෙවිකරණ සම්බන්ධීකරණය 324 • පිරිවැය ගණනය 338 • ව්‍යාපාර සැලසුම් සකස් කිරීම 275
ආපදා අංශය	01. වැඩසටහන් 06ක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන හා අනුග්‍රාහකත්වයන් සොයා ගැනීම. 02. සැලැස්මට අනුව කටයුතු කිරීමෙදි සමහර අංශවල යම් යම් ප්‍රමාදයන් සිදුවීම. 03. මේ සඳහා අදාළ ග්‍රාමීය ප්‍රජාව ඇතුළු සියළුම පාර්ශව සක්‍රියව සහභාගී කර ගැනීමේ ගැටළු 04. මුද්‍රණය කිරීමෙදි ඇති වන මූල්‍යමය අපහසුතා	1. පාසැල් සිසුන් 700 ක ප්‍රමාණයක් ආපදා තත්ත්වයන් පිළිබඳව දැනුවත් කිරීම. 2. නිරිත දිග මෝසම පෙර සූදානම් සැලසුම් සැකසීම සඳහා පසුගිය වසරට අදාළ උගත් පාඩම් සාකච්ඡා කිරීම . 3. ආපදා තත්ත්වයන් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම හරහා එම ගැටළු අවම කර ගැනීම සඳහා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලැස්ම හා ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලැසුම් 18 යාවත්කාලීන කිරීම. 4. ග්‍රාමීය ආපදා කළමනාකරණ සැලැසුම් 15 සැකසීම. 5. ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීම. 6. පූර්ව ආපදා තත්ත්වයන් හා පශ්චාත් ආපදා තත්ත්වයන් සම්බන්ධව ජනතාව විසින් සිදු කරනු ලබන පැමිණිලි 60ක් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම.
සමෘද්ධි අංශය	01. ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා අක්මුදල් ප්‍රමාද වීමත්,මැතිවරණ ප්‍රකාශයට පත් කිරීම නිසා ආදර්ශ ගම්මාන වැඩසටහනෙහි බුලත් වගාව සම්බන්ධයෙන් දිස්ත්‍රික්කය තුළ ප්‍රසම්පාදන කටයුතු කරගැනීමට නොහැකි වීම. 02. පවුල් සවිබල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නිබු ක්‍රමවේදය වෙනස් කිරීම නිසා නව වැඩසටහන 2025 වර්ෂයට ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබීම. 03. 2024 වර්ෂයේ කොවිඩ් අරමුදල්වල මුදලින් 90% යොදාගෙන දිස්ත්‍රික්කයේ සවිබලගැන්වීම වැඩසටහන ක්‍රියාත්මක කිරීම. I ප්‍රතිපාදන හා අක්මුදල් ප්‍රමාණවත් නොවීම. ii පුද්ගලික ලිපි ගොනු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ඇති අපහසුතාව.	1. නිලධාරියා විශ්‍රාම ගොස් අවම මාස 03 ක් ඇතුළත විශ්‍රාම වැටුප් ලබා ගත හැකි පරිදි කටයුතු කිරීම. (විශ්‍රාම වැටුප්) – මයකට විශ්‍රාම ගොනු 05 ක් පමණ සම්පූර්ණ කර, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. 2. (පුහුණු)-අභියෝග අවම කිරීමට නිලධාරීන් දැනුවත් කර අභිප්‍රේරණය කිරීමට වැඩපිළිවෙලක් සැකසීම

2025 වර්ෂයේ ලභාකර ගැනීමට අපේක්ෂිත විශේෂ ඉලක්කයන්

➢ රත්නපුර ගං වතුර පාලනයට වියළි බැම් (DRY DAMS) ඉදිකිරීම

රත්නපුර නාගරික සංවර්ධන සැලැස්මේ පරිදිම, රත්නපුර ගං වතුර පාලනයට වියළි බැම් (DRY DAMS) ක්‍රමය පිළිබඳ පූර්ණ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම රත්නපුර දිස්ත්‍රික්කය විශේෂයෙන් නිරන්තරයෙන් ජල ගැලීම්වලට ලක්වන දිස්ත්‍රික්කයක් වන බැවින් මෙලෙස ඇතිවන ගං වතුර තත්ත්වයන් පාලනය කිරීම සඳහා පූර්ණ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර වියළි බැම් 03 ක් හඳුනාගත් ස්ථානයන්හි ඉදිකිරීම



➢ දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025 – 2029.



➢ ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

යැපුම් මානසිකත්වයෙන් මිදී ස්වාධීන පුරවැසි සමාජයක් ගොඩනැගීම උදෙසා ප්‍රජාව සවිබල ගන්වා ඒ තුළින් ගොඩනැගෙන ශක්තිත් පදනම් කර ගනිමින් පංචවිධ සවිබලගැන්වීමේ වැඩසටහනක් ඔස්සේ රටේ සෑම පුරවැසියෙකුම ජාතික ආර්ථිකයේ අභිමානවත් කොටස්කරුවෙකු බවට පත් කිරීම පිණිස සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ප්‍රජා සවිබල ගැන්වීම් වැඩසටහන හඳුන්වා දී ක්‍රියාත්මක කරනු ලබයි.

දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය


කේ.ජී.වස්. නිශාන්ත
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
රත්නපුර.

47

03 - පරිච්ඡේදය

සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 සමස්ත මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය



ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය 2024 රු.	2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	ප්‍රේෂිය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		7,874,348,835	4,572,010,180	ඒසීඒ-3
-	තැන්පතු		491,358,260	331,701,964	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		111,526,263	77,232,244	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		8,477,233,358	4,980,944,389	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		8,477,233,358	4,980,944,389	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		16,471,185	5,689,537	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		8,460,762,173	4,975,254,852	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
1,791,730,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,768,722,374	1,084,325,335	
277,300,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	238,044,593	210,869,343	ඒසීඒ-2(ii)
897,625,053	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	893,606,819	115,002,033	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
2,966,655,053	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		2,900,373,786	1,410,196,712	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
65,500,000	වැඩිදියුණු කිරීම්	10	56,899,839	49,468,238	
175,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	24,946,124	12,560,256	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
4,500,000	හැකියා වර්ධනය	14	2,397,099	2,388,622	
-	වෙනත් මූලධන වියදම්	15	-	6,527,091	
245,000,000	මුළු මූලධන වියදම් (උ)		84,243,061	70,944,207	
	තැන්පතු ගෙවීම්		334,788,315	412,707,013	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		199,931,259	75,169,604	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		534,719,573	487,876,617	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		3,519,336,421	1,969,017,536	
3,211,655,053	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		4,941,425,752	3,006,237,316	
	අග්‍රිම හැලසුම් ප්‍රකාශනය අනුව ශේෂය		4,941,425,752	3,006,237,256	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	60	ඒසීඒ-3
			-		

1

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒඑසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	කත්‍ය 2024 රු.	කත්‍ය 2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියක හා උපකරණ	ඒඑසිඒ-6	2,436,021,803	12,505,096,823
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒඑසිඒ-5/5(ඒ)	276,343,537	187,938,542
මුදල් හා මුදල් සමාන දෑ	ඒඑසිඒ-3	-	60
මුළු වත්කම්		**2,712,365,340**	**12,693,035,425**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		18,604,233	86,769,183
දේපළ පිරියක හා උපකරණ සංචිතය		2,436,021,803	12,505,096,823
ඵලදී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒඑසිඒ-5(ඩී)		
යුතුම වගකීම්			
ණයකරු ගිණුම්	ඒඑසිඒ-4	257,739,304	101,169,359
අවසාන ශේෂය	ඒඑසිඒ-3	-	60
මුළු වගකීම්		**2,712,365,340**	**12,693,035,425**

පිටු අංක 1 සිට 45 දක්වා ඒඑසිඒ 1 සිට ඒඑසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 46 සිට 53 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16** දිනැති **රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනය සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම : එස්. ආලෝකබණ්ඩාර	නම : කේ.ජී.එස්.නිශාන්ත	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර : ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	තනතුර : ලේකම්/දිසාපති , රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය	නම : එස්. පී. චන්ද්‍රපාල
දිනය : 2025.02. 20	දිනය : 2025.02. 19	දිනය : 2025.02. 19

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

කේ.ජී.එස්. නිශාන්ත
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
රත්නපුර.

එස්.පී. චන්ද්‍රපාල
ප්‍රධාන ගණකාධිකාරි
රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය


ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කණ්ඩ	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	196,675,564	234,586,662
අග්‍රිම ලැබීම්	7,874,348,835	4,572,010,180
අත්තිකාරම් අයකර ගැනීම්	126,763,554	104,052,233
තැන්පතු ලැබීම්	491,505,085	331,718,049
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**8,689,293,039**	**5,242,367,123**
අඩුකළා : මුදල් බැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,005,552,312	1,294,493,819
සහනාධාර සහ මාරුකිරීම්	893,606,819	115,002,033
වෙනත් බැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	5,226,272,491	3,222,911,955
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	16,471,185	5,689,537
අත්තිකාරම් ගෙවීම්	128,586,031	120,700,619
තැන්පතු ගෙවීම්	334,935,139	412,723,098
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා බැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**8,605,423,977**	**5,171,521,062**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**83,869,061**	**70,846,062**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	374,000	98,205
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**374,000**	**98,205**
අඩුකළා : මුදල් බැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	84,243,061	70,944,207
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා බැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**84,243,061**	**70,944,207**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(83,869,061)**	**(70,846,002)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	60
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් බැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා බැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	60
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	60

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්



ඒඝිඒ -2

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 278

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/පළාත් සභාවේ නම : රත්නපුර

රු.

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	1,895,000,000	1,071,655,053	- 10,100,000	2,966,655,053	2,900,373,786	66,281,267
	(2) ප්‍රාග්ධන	245,000,000		(10,100,000) -	245,000,000	84,243,061	160,756,939
	උප එකතුව	2,140,000,000	1,071,655,053	-	3,211,655,053	2,984,616,848	227,038,205
වැඩසටහන (2)	(1) පුනරාවර්තන	-					
	(2) ප්‍රාග්ධන	-					
	උප එකතුව	-					
	මුළු එකතුව	2,140,000,000	1,071,655,053	-	3,211,655,053	2,984,616,848	227,038,205

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්)/කොමසාරිස් (මූදල්)
දිනය : 2025.02.14

එස්. පී. චන්දපාල
ප්‍රධාන ගණකාධිකාරි
රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

07

ඒසීඒ- 2(iv)

වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රත්නපුර
වියදම් ශීර්ෂ අංකය : 278

	මූල්‍යකරණය	වැඩසටහන 01*		වැඩසටහන 02*		මුළු එකතුව		
සංකේතය	සංකේත විස්තරය	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	වියදමේ ප්‍රතිශතය ***
		1	2	3	4	5	6	(6÷5)X100
		රු.	රු.	රු.	රු.	රු.	රු.	%
11	දේශීය අරමුදල්	3,211,655,053	2,984,616,848			3,211,655,053	2,984,616,848	93
12	විදේශ ණය							
13	විදේශ ප්‍රදාන							
14	ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය							
15	ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන							
16	ප්‍රතිපාර්ශවීය අරමුදල්							
17	විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය							
18	විදේශීය මූල්‍යයනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය							
21	විශේෂ නීති සේවා							
	එකතුව	3,211,655,053	2,984,616,848	-	-	3,211,655,053	2,984,616,848	93

* ඒසීඒ- 2 (v) අනුව එක් එක් වැඩසටහන් යටතේ ඇති අගයන් ඇතුළත් කරන්න
** ඒසීඒ- 2 හි 4 වන තීරුවට යොමුගත ප්‍රතිපාදන
*** දශමස්ථාන රහිතව % සඳහන්කරන්න

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025.02. 14

එස්. පී. චන්ද්‍රපාල
ප්‍රධාන ගණකාධිකාරි
රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

ඒඑඒ- 2(v)

එක් එක් වැඩසටහන් යටතේ ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය

(වැඩසටහනක ව්‍යාපෘති අනුව මූලධන වියදම් හා පුනරාවර්තන වියදම්වල මූල්‍යකරණය)

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රත්නපුර
වියදම් ශීර්ෂ අංකය : 278
වැඩසටහන් අංකය හා නාමය : මෙහෙයුම් වැඩසටහන

සංකේතය	මූල්‍යකරණය / සංකේත විස්තරය	ව්‍යාපෘති 1		ව්‍යාපෘති 2		ව්‍යාපෘති 3		වැඩසටහනේ එකතුව/පිටුවේ එකතුව*	
		ශුද්ධ ප්‍රතිපාදනය	සත්‍ය වියදම	ශුද්ධ ප්‍රතිපාදනය	සත්‍ය වියදම	ශුද්ධ ප්‍රතිපාදනය	සත්‍ය වියදම	ශුද්ධ ප්‍රතිපාදනය	සත්‍ය වියදම
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
11	දේශීය අරමුදල්	1,856,835,053	1,675,863,248	1,354,820,000	1,308,753,600			3,211,655,053	2,984,616,848
12	විදේශ ණය								
13	විදේශ ප්‍රදාන								
14	ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය								
15	ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන								
16	ප්‍රතිපාර්ශවීය අරමුදල්								
17	විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය								
18	විදේශීය මූල්‍යයනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය								
21	විශේෂ නිති සේවා								
	එකතුව	1,856,835,053	1,675,863,248	1,354,820,000	1,308,753,600	-	-	3,211,655,053	2,984,616,848

*වැඩසටහනක් වෙනුවෙන් අතිරේක පිටු එකතු කරන්නේ නම් අවසාන පිටුවේ එකතුව මුළු වැඩසටහනේ එකතුව විය යුතු ය.

.....
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025.02. 14

ඩබ්. පී. චන්ද්‍රපාල
ප්‍රධාන ගණකාධිකාරී
රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

40

ඒඩිජ්-3

2024 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රත්නපුර
වියදම් ශීර්ෂ අංකය : 278

රු.

අග්‍රිම ගිණුම් අංකය	2024 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය 1			අග්‍රිම ලැබීම් 2			අග්‍රිම පියවීම් 3			2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 4			2024 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව ශේෂය	2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
	නොපියවූ උප අග්‍රිම	නොපියවූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර)	එකතුව	භාණ්ඩාගාරයෙන්	වෙනත් මූලාශ්‍රවලින්	එකතුව	වියදම් මඟින්	මුදල් මඟින්	එකතුව	නොපියවූ උප අග්‍රිම ශේෂය	නොපියවූ අග්‍රිම ශේෂය	එකතුව	*5	6
	1(i)	1(ii)	1(iii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	3(i)	3(ii)	3(iii)=3(i)+3(ii)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=1(iii)+2(iii)-3(iii)	
317/23		60	60					60	60	-	-	-	-	-
317/24				7,874,348,775.11	536,546,760.08	8,410,895,535.19	8,394,424,349.93	16,471,185.26	8,410,895,535.19	-	-	-	-	-

1. ඉහත 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න

(1) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2024.12.31 දිනට මුදල් ශේෂය 5,689,536.88

(2) වෙනත් හේතු - ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2023.12.31 දිනට මුදල් ශේෂය 5,689,536.88

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.
ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025.02. 14

එස්. පී. චන්ද්‍රපාල
ප්‍රධාන ගණකාධිකාරී
රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

* මෙම ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි පෙන්විය යුතු ය.**

41

විගණන වර්ෂ අංකය : 278

2024 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රත්නපුර

ඒඑසී -4

රු.

තැන්පතු ගිණුමේ නම	තැන්පතු අංකය	2024 ජනවාරි 01 දිනට ශේෂය	වර්ෂය තුළ බැර කිරීම	වර්ෂය තුළ හර කිරීම	2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
ඇප තැන්පත්	6000-0-0-001-0-042-0	2,828,208.92	4,417,884.37	3,113,172.09	4,132,921.20	4,132,921.20
ටෙන්ඩර් තැන්පත්	6000-0-0-002-0-056-0	228,038.70	446,170.00	584,778.50	89,430.20	89,430.20
තෙවන පාර්ශ්වයන් වෙත නැවත ගෙවීම් කිරීම් වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු	6000-0-0-013-0-043-0	2,747,977.56	125,741,815.11	110,067,680.18	18,422,112.49	18,422,112.49
කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල්	6000-0-0-016-0-011-0	13,482,710.70	159,270,727.37	26,637,952.88	146,115,485.19	146,115,485.19
වන්දි ගෙවීම	6000-0-0-017-0-002-0	65,047,324.86	76,719,356.28	79,972,568.80	61,794,112.34	61,794,112.34
ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම්	6000-0-0-018-0-013-0	16,835,098.08	124,762,306.90	114,412,162.26	27,185,242.72	27,185,242.72

* අදාළ තැන්පතු අංක පමණක් යොදාගෙන ආකෘතිය සංශෝධනය කර ගත යුතු ය.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූල්‍ය) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025.02. 14

එස්. පී. චන්ද්‍රපාල
ප්‍රධාන ගණකාධිකාරි
රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

42

ඒසිඒ- 5

2024 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 278

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රත්නපුර

රු.

අත්තිකාරම් ගිණුමේ නම	අත්තිකාරම් ගිණුම් අංකය	2024 ජනවාරි 01 දිනට ශේෂය (1)	වියදමෙහි උපරිම සීමා රු. 95,000,000		ලැබීම්වල අවම සීමා රු. 70,000,000		හර ශේෂයන්ගේ උපරිම සීමා රු. 400,000,000	බැරකම් පිළිබඳ උපරිම සීමා රු.	2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
			වර්ෂය තුළ හර කිරීම් (2)		වර්ෂය තුළ බැර කිරීම් (3)		ශේෂය 4=(1)+(2)-(3)		
			මුදලින්	හරස් සටහන් මඟින්	මුදලින්	හරස් සටහන් මඟින්			
(1) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම	27801	187,938,541.88	95,214,279.87	104,716,978.80	90,271,767.74	21,254,495.40	276,343,537.41		276,343,537.41


43

ඒසිඒ-6

මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය - 2024

ACA-6 ආකෘතිය වෙනුවට නව CIGAS වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව මෙහි අමුණා තිබිය යුතු ය.





2/2025, 09:40 newcigas.treasury.gov.lk/T_Statements_24/T24_Asset_Final.aspx

Cumulative Non Financial Asset Accounts Report- Central Govt-2024

FINAL 2024 REPORTS

Land-9153: 604,667,500.00 Table: SA 82
Building- 9151: 1,047,722,889.68 Year: 2024
Machinary-9152: 439,815,780.33 Rpt Date 2/10/2025 9:39:23 AM
WIP-9160: 343,815,632.73 Head 278
Intangible-9154: 0.00
Lease-9180: 0.00

Ledger	category	Item	Code	Opn_Bal	Opn_Bal_Add	TransferIn	Purchase	Disposal	Balance
9151	1.1-Dwellings		61111	73,113,700.14	0.00	0.00	0.00	0.00	73,113,700.14
		Garages	****6111102	581,500.00	0.00	0.00	0.00	0.00	581,500.00
		Quarters	****6111107	72,532,200.14	0.00	0.00	0.00	0.00	72,532,200.14
9151	1.2-Non Residential Building		61112	974,176,924.67	155,141.14	0.00	0.00	0.00	974,332,065.8
		Office Building	****6111201	968,026,924.67	155,141.14	0.00	0.00	0.00	968,182,065.8
		Schools	****6111202	6,150,000.00	0.00	0.00	0.00	0.00	6,150,000.00
9151	1.3-Other Structure		61113	277,123.73	0.00	0.00	0.00	0.00	277,123.73
		Structures associated with mining subsoil assets	****6111307	187,123.73	0.00	0.00	0.00	0.00	187,123.73
		Pumping Station	****6111311	90,000.00	0.00	0.00	0.00	0.00	90,000.00
9160	1.4-WIP-Building & Structure		61114	343,815,632.73	0.00	0.00	0.00	0.00	343,815,632.7
		Office Building	****611148	343,815,632.73	0.00	0.00	0.00	0.00	343,815,632.7
9152	2.1-Transport Equipment		61121	199,709,399.00	0.00	0.00	0.00	0.00	199,709,399.0
		Passenger vehicle	****6112101	198,509,399.00	0.00	0.00	0.00	0.00	198,509,399.0
		Cargo vechicle	****6112102	1,200,000.00	0.00	0.00	0.00	0.00	1,200,000.00
9152	2.2-Other Machinary & Equipment		61122	207,694,734.14	9,326,589.27	0.00	24,946,123.75	1,861,065.83	240,106,381.3
		Office Equipment	****6112201	34,459,234.74	1,005,988.53	0.00	1,004,060.00	327,408.50	36,141,874.77
		Computer Equipment	****6112202	81,777,493.22	5,872,246.06	0.00	10,469,453.00	987,161.80	97,132,030.48
		Electrical Equipment	****6112203	20,465,431.67	436,619.00	0.00	5,656,695.00	176,687.00	26,382,058.67
		Communication Equipment	****6112204	7,911,466.33	295,100.00	0.00	4,234,588.00	28,600.00	12,412,554.33
		Furniture	****6112205	58,839,029.34	1,698,335.68	0.00	3,208,602.75	334,228.53	63,411,739.24
		Medical Equipment	****6112207	115,285.71	0.00	0.00	0.00	0.00	115,285.71
		Sports equipment	****6112208	20,608.58	0.00	0.00	0.00	0.00	20,608.58
		Books Periodical & Journals	****6112210	5,950.00	0.00	0.00	0.00	0.00	5,950.00

https://newcigas.treasury.gov.lk/T_Statements_24/T24_Asset_Final.aspx 44 - T 1/2

		Construction Eqipment	****6112213	1,894,835.00	0.00	0.00	13,000.00	1,230.00	1,906,605.00
		Defence Equipment	****6112215	1,087,599.50	18,300.00	0.00	333,700.00	0.00	1,439,599.50
		Agricultural & Dairy Farm Equipment	****6112216	1,008,796.25	0.00	0.00	26,025.00	5,750.00	1,029,071.25
		Fire Protection Equipment	****6112217	109,003.80	0.00	0.00	0.00	0.00	109,003.80
9153	4.1-Land		61410	580,537,500.00	0.00	0.00	0.00	0.00	580,537,500.0
		Land	****614100	580,537,500.00	0.00	0.00	0.00	0.00	580,537,500.0
9153	4.1-Urban or Built-Up Land		61411	24,130,000.00	0.00	0.00	0.00	0.00	24,130,000.00
		Mixed Urban	****6141104	24,130,000.00	0.00	0.00	0.00	0.00	24,130,000.00

REMARKS

This is a computer-generated document. No signature is required.

-

Report Generated by the new CIGAS Web Application--Developed by S.Tharshan - Director, Dept of State Accounts

ඒසිඒ-7


අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය

වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම්	5,226,272,491	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම් වෙතුවෙන් කරන ලද හර කිරීම්	12,724,404	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම්	10,198,475	
අනෙකුත් ශීර්ෂ විසින් තැන්පත් ගිණුමට කරන ලද බැර කිරීම්	146,825	5,249,342,194
අඩු කළා :		
අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම්	197,049,564	
වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම්	1,214,655	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම් වෙතුවෙන් කරන ලද බැර කිරීම්	25,435,767	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම්	84,069,632	
අනෙකුත් ශීර්ෂ විසින් තැන්පත් ගිණුමට කරන ලද හර කිරීම්	146,825	307,916,442
2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය		**4,941,425,752**

* ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කළ හැක.

එස්. පී. චන්ද්‍රපාල
ප්‍රධාන ගණකාධිකාරී
ජාතික විගණන කාර්යාලය
ජාතික විගණන කාර්යාලය
ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් වෙනුවට

45



පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

(මූ.රෙ. 106 හා මූ.රෙ. 113 යටතේ වන පාඩු)

ඇමුණුම - (i)

වියදම් ශීර්ෂ අංකය : 278

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රත්නපුර

වැඩසටහන් අංකය හා නාමය :

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	නැත	
රු	25,000.01	වැඩි	නැත	
	එකතුව			

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2		
3		
4		
එකතුව		

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි		
	එකතුව			

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2		
3		
4		
එකතුව		

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මූ.රෙ. 106 යටතේ වන හානි හා මූ.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2025.02. 14

එස්. පී. චන්ද්‍රපාල
ප්‍රධාන ගණකාධිකාරී
රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

* නම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව නොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

46

ඇමුණුම -(ii)

පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 278

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රත්නපුර

වැඩසටහන් අංකය හා නාමය:

1 වර්ෂය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

	අගය	සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	-	-
(ii)	රු. 25,000.01 වැඩි	4	1,225,370
	එකතුව	4	1,225,370

2 වර්ෂය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

	අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම් සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1	ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ SG - 4909 රථය අනාතුරට ලක්වීම	309,504	366,121	56,617	-	309,504	අලාභය සම්බන්ධව කව දුරටත් පරීක්ෂණය සිදු කරමින් පවතී
2	කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 252-9836 දරණ රථය අනාතුරට ලක්වීම	102,749	102,749	102,749		-	අනතුර සිදු කළ පාර්ශ්වයෙන් අලාභය අය කර ගැනීම් සඳහා කරන ලද නීතිමය කටයුතු අවසන් කර අදාළ අලාභය වන රු. 102,748.92 ක මුදල අයකර ගෙන ඇත. (මුදල් කුවිතාන්සි අංක 21/424538 හා දිනය 2024.07.12)
3	රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ PA 4911 අංක දරණ රථය අනාතුරට ලක්වීම	636,000	636,000			636,000	අදාළ නිලධාරීන්ගෙන් අලාභය අය කර ගැනීම සඳහා පරීක්ෂණ කටයුතු කරමින් පවතී
4	රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 32 - 2235 අංක දරණ රථය අනාතුරට ලක්වීම	120,500	120,500			120,500	අදාළ රක්ෂණ සමාගමෙන් අලාභය අය කර ගැනීමට නීතිමය කටයුතු කර ඇත.
	එකතුව	1,168,753	1,225,370	159,366	-	1,066,004	

සටහන් - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මූ.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතුය

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මූදල්) /කොමිසාරිස් (මූදල්)
දිනය : 2025.01.14

එස්. පී. චන්ද්‍රපාල
ප්‍රධාන ගණකාධිකාරී
රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

* කම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව කොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

47

ඇමුණුම - (viii)

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2024.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය : 278

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රත්නපුර

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2024.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2024.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2024.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන්න ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	ලංකා බැංකුව රත්නපුර	7042294	70,114,715.46	-	-	2024 දෙසැම්බර්
2	මහජන බැංකුව (යූනියන් පෙදෙස)	014-100269027083	7,797,000.00	-	-	2024 දෙසැම්බර්
3	ලංකා බැංකුව අයගම	7042309	41,087,344.86	-	-	2024 දෙසැම්බර්
4	ලංකා බැංකුව කුරුවිට	7042303	52,276,647.38	-	-	2024 දෙසැම්බර්
5	ලංකා බැංකුව පැල්මඩුල්ල	7042312	12,630,360.25	-	-	2024 දෙසැම්බර්
6	ලංකා බැංකුව රත්නපුර (ඇලපාත ප්‍රා.ලේ.)	7042300	19,537,648.20	-	-	2024 දෙසැම්බර්
7	ලංකා බැංකුව කොලොන්න	7042321	28,519,931.46	-	-	2024 දෙසැම්බර්
8	ලංකා බැංකුව කහවත්ත	7042323	22,687,706.70	-	-	2024 දෙසැම්බර්
9	ලංකා බැංකුව රත්නපුර	7042297	112,569,462.80	-	-	2024 දෙසැම්බර්
10	ලංකා බැංකුව ඇහැලියගොඩ	7042306	37,538,681.04	-	-	2024 දෙසැම්බර්
11	ලංකා බැංකුව ඇඹිළිපිටිය	7042318	25,137,369.54	-	-	2024 දෙසැම්බර්
12	ලංකා බැංකුව ඕපනායක	7042315	34,806,213.91	-	-	2024 දෙසැම්බර්
13	මහජන බැංකුව නිවිතිගල	192-100159027104	30,440,317.63	-	-	2024 දෙසැම්බර්
14	මහජන බැංකුව බළංගොඩ (ඉඹුල්පේ ප්‍රා.ලේ.කා.)	017-100119027089	63,967,155.04	-	-	2024 දෙසැම්බර්
15	මහජන බැංකුව කලවාන	235-100189027098	54,703,451.18	-	-	2024 දෙසැම්බර්
16	මහජන බැංකුව බළංගොඩ	017-100159027092	74,690,892.79	-	-	2024 දෙසැම්බර්
17	මහජන බැංකුව බළංගොඩ (වැලිගෙපොල ප්‍රා.ලේ.කා.)	017-100179027086	11,587,804.57	-	-	2024 දෙසැම්බර්
18	මහජන බැංකුව ඔංඩකවෙල	245-100129027095	39,439,891.53	-	-	2024 දෙසැම්බර්
19	මහජන බැංකුව කිරිඇල්ල	266-100129027101	36,361,050.38	-	-	2024 දෙසැම්බර්
20	ලංකා බැංකුව වෙලිඔය (කල්තොට	7042295	12,927,776.86	-	-	2024 දෙසැම්බර්

ඉහත සඳහන් කොරතුරු සත්‍ය හා නිවැරදි බවට කහවුරු කරමි.


එස්. පී. චන්ද්‍රපාල
ප්‍රධාන ගණකාධිකාරි
රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවෙන්

ප්‍රධාන ගිණුම් නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ගණකාධිකාරිස් (මුදල්)

දිනය: 2025.02.14

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - 2024


අනු අංක	ආදායම් ශීර්ෂය	වැය විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		2024.12.31 දිනට එකතු කරන ලද ආදායම	
			මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1	1003.07.02	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව -ලියාපදිංචි ගාස්තු	45,000	-	150	0%
2	1003.07.03	පෞද්ගලික දැව ප්‍රවාහන ගාස්තු	800	500	542	92%
3	1003.07.04	මෝටර් රථ වාහන විකිණීම මත බදු	10	10	-	
4	1003.07.05	ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ ගාස්තු	660	900	1,018	88%
5	1003.07.09	කාබන් බද්ධ සඳහා ආදායම්	200	200	500	40%
6	1003.07.99	අනෙකුත් -බලපත්‍ර ගාස්තු	9,000	15,000.00	16,402	91%
7	2002.01.01	රජයේ ගොඩනැගිලි කුලී	2,000	2,000.00	2,736	73%
8	2002.01.02	කැලෑ ගාස්තු	10	10	-	
9	2002.01.03	ඉඩම් හා අනෙකුත් බදු	500	500	-	
10	2002.02.99	වෙනත් -පොලිය	10,000	10,000.00	12,360	81%
11	2003.01.00	දෙපාර්තමේන්තුමය විකිනීම්	50	50	50	100%
12	2003.02.13	විභාග දෙපාර්තමේන්තුව -විභාග ගාස්තු	150	150	-	
13	2003.02.14	මෝටර් රථප්‍රවාහන දෙපාර්තමේන්තුව හා අදාල ගාස්තු	40,000	40,000.00	2,171	1842%
14	2003.02.03	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු	20,000	20,000.00	24,919	80%
15	2003.02.99	විවිධ - රජයේ ආදායම	40,000	40,000.00	30,414	132%
16	2003.03.02	දඩමුදල් හා රාජසන්තක කිරීම් -අනෙකුත්		-	-	
17	2003.99.00	අනෙකුත්ලැබීම්	5,000	5,000.00	18,059	28%
18	2003.04.00	යතුරු පැදි ගෙවීම්		-	-	
19	2003.02.06	වන සංරක්ෂණ ගාස්තු		-	0	0%
20	2003.07.00	වී මිලදී ගැනීම්		-	-	
21	2004.01.00	සමාජ ආරක්ෂණ දායක අරමුදල්	74,000	74,000.00	90,371	82%
22	2006.02.00	ප්‍රාග්ධන වත්කම් විකිණීම	200	200	374	53%
		මුළු එකතුව	**247,580**	**208,520.00**	**200,067**	**96%**
		ආදායමින් ආපසු ගැනීම්			**3,017**	
		ශුද්ධ එකතුව	**247,580**	**208,520.00**	**197,050**	**94%**



3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය (ශීර්ෂය 278)

(රු.'000)

විස්තරය	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය	තත්‍ය වියදම	ප්‍රතිශතය (%)
පුනරාවර්තන	1,895,000	2,966,655	2,900,374	**97.77**
ප්‍රාග්ධන	245,000	245,000	84,243	**34.38**
මුළු එකතුව	**2,140,000**	**3,211,655**	**2,984,617**	**92.93**



3.7 මු. රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන කාර්යසාධනය

(රු.)

ශීර්ෂය	අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	2024 ප්‍රතිපාදනය	2024.12.31 දිනට වියදම	ඉතිරිය/අතිරික්තය
**පුනරාවර්තන වියදම් ** **		**3,394,813,746.09**	**2,977,683,735.32**	**417,130,010.77**
1	ජනාධිපති අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන -2024	339,425.00	299,490.00	39,935.00
1	ජනාධිපති අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන(දානමය කටයුතු සඳහා)	291,600.00	288,000.00	3,600.00
20	මැතිවරණ කාර්යය මණ්ඩල ගෙවීම් ප්‍රතිපූර්ණයකිරීම සඳහා	3,104,148.00	3,104,148.00	-
103	කඩිනම් ආපදා සහන සැලසීම යටතේ වියළි සලාක හා පිසූ ආහාර ලබා දීම වෙනුවෙන් ප්‍රතිපාදන	57,870,062.06	55,507,679.94	2,362,382.12
103	තක්සේරු දීමනා - ආපදා තත්ව හේතුවෙන් හානියට පත් නිවාස / දේපළ තක්සේරුව	585,200.00	581,700.00	3,500.00
171	ගැබිණි මව්වරුන් සඳහා රු.45,000/- ක පෝෂණ දීමනාව ලබා දීමේ වැඩසටහන	423,788,330.00	417,938,852.52	5,849,477.48
171	පෙර පාසැල් දරුවන් සඳහා උදැසන ආහාරවේල	96,859,160.00	78,966,680.00	17,892,480.00
171	ගුරු අභිමානී පෙර පාසල් ගුරු දීමනාව - රු.2500/-	41,765,000.00	41,680,000.00	85,000.00
ප්‍රාග්ධන වියදම		**2,805,292,625.05**	**2,246,670,364.13**	**558,622,260.92**
1	ජනසභා ක්‍රමයේ අවශ්‍යතාවය සහ එහි ඉදිරි කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	102,639.29	50,040.00	52,599.29
1	උරුමය ජාතික වැඩසටහන යටතේ පවත්වනු ලබන පළමු ඔප්පු ප්‍රදානෝත්සවය	15,996,100.00	15,669,821.02	326,278.98
1	වතු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති	2,200,000.00	2,157,941.48	42,058.52
1	විමධ්‍යගත අයවැය වැඩසටහන -2024	611,821,000.00	540,276,009.62	71,544,990.38
1	වතුකරයේ ක්‍රියාත්මක ලියාපදිංචි ක්‍රීඩා උපකරණ ලබාදීම සඳහා	2,454,990.00	-	2,454,990.00
101	ව්‍යාපෘති	2,580,526.00	2,239,903.84	340,622.16
101	නර්තන භාණ්ඩ අළුත්වැඩියා කිරීම	101,500.00	93,000.00	8,500.00
101	වැඩසටහන්	135,500.00	135,500.00	-
101	වැලිගෙපොල සංස්කෘතික මධස්ථානයේ ඉතිරි වැඩ නිම කිරීම.	11,600,000.00	10,135,076.47	1,464,923.53
101	පූජා භූමි හා බෞද්ධ කටයුතු	1,499,962.55	1,426,805.24	73,157.31
101	ග්‍රාමීය විහාරස්ථාන වැඩිදියුණු කිරීම	4,100,000.00	3,955,774.11	144,225.89
101	තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන	294,450.00	286,716.48	7,733.52
103	ආපදා අවම කිරීමේ ව්‍යාපෘති	5,500,000.00	2,482,526.00	3,017,474.00


103	නැවත පදිංචි කිරීමේ වැඩසටහන- ආපදා කළමනාකරණ	117,475,328.30	106,271,964.11	11,203,364.19
103	සුරක්ෂිත මධ්‍යස්ථාන	4,340,852.40	4,340,720.37	132.03
103	අත්තිකාරම්-ආපදා	156,063,138.61	148,740,060.86	7,323,077.75
110	කලා හා සංස්කෘතික වැඩසටහන	2,745,200.00	2,706,473.65	38,726.35
110	ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන ව්‍යාපෘති	1,636,550.00	1,632,772.50	3,777.50
110	ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන ව්‍යාපෘති	1,699,490.00	1,435,971.50	263,518.50
110	සහජීවන සංගම් පිහිටුවීම හා ප්‍රතිව්‍යුහගත කිරීම	92,070.00	87,804.70	4,265.30
111	කාර්යාල උපකරණ මිලදී ගැනීම.	52,000.00	39,651.25	12,348.75
117	ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන	189,033,984.36	138,684,526.62	50,349,457.74
118	පුහුණු වැඩමුළු	78,832.00	78,822.00	10
118	ආහාර සුරක්ෂිතතාව හා තාක්ෂණ වැඩසටහන	3,454,700.00	3,454,625.00	75
118	දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු සඳහා	155,000.00	97,251.53	57,748.47
118	කෘෂිකර්ම නවීකරණ වැඩසටහන	62,141,204.25	14,662,043.42	47,479,160.83
122	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වැඩ බලන නිලධාරීන්ගේ ඉන්ධන වියදම් සඳහා	52,000.00	3,000.00	49,000.00
122	ඉඩම් අත්කර ගැනීමට අදාළව පරිපාලන වියදම් සඳහා	29,815,755.12	29,730,185.32	85,569.80
123	කඳුකර දශකය 2024 -2033 දශවිධ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන	1,400,000,000.00	1,066,340,828.42	333,659,171.58
126	පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමේ සංවර්ධන වැඩසටහන්	6,100,000.00	5,984,443.80	115,556.20
126	සංග්‍රහ වියදම්	30,000.00	27,200.00	2,800.00
130	කළමනාකරණ සේවා නිලධාරී සේවයේ 1 ශ්‍රේණියේ සඳහා නිර්දේශිත පාඨමාලාව	271,000.00	192,184.00	78,816.00
130	නාම පුවරු සකස් කිරීම	614,750.00	614,750.00	-
130	සංචාරක බංගලා වැඩිදියුණු කිරීම	873,100.00	700,091.44	173,008.56
130	සංචාරක නිවාස සඳහා ගෘහ භාණ්ඩ	170,000.00	157,500.00	12,500.00
130	සංචාරක නිවාස යන්ත්‍රෝපකරණ	48,000.00		48,000.00
149	නාලන්ද එල්ලාවල කර්මාන්තපුර අදියර 1 සහ 2 සඳහා ජලනල එලීම	4,407,307.86	4,407,307.86	-
149	යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	7,000.00	7,000.00	-
149	යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	233,881.00	233,881.00	-
149	ව්‍යාපෘති	24,500.00	24,500.00	-
160	ජගත් පරිසර දිනයට සමගාමීව වැඩසටහන්	833,000.00	365,835.00	467,165.00
166	වතුකරයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	500,000.00	372,098.27	127,901.73
171	යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	100,000.00	90,585.00	9,415.00
171	දැනුවත් කිරීමේ වැඩසටහන්	190,945.00	166,355.00	24,590.00
171	දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු	1,017,730.08	792,530.08	225,200.00
171	ස්වයං රැකියා ආධාර	532,950.00	523,003.00	9,947.00
171	උපදේශන වැඩසටහන්	200,000.00	200,000.00	-
171	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන	18,836,778.46	17,767,060.69	1,069,717.77
193	සේවා ආයතන ඵලදායිතාවෙන් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන	123,950.00	123,950.00	-
193	ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා	155,000.00	134,265.00	20,735.00
194	පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන	40,977,592.73	23,019,325.17	17,958,267.56
194	ප්‍රාග්ධන වියදම්	632,400.00	485,361.99	147,038.01
194	ප්‍රාග්ධන වියදම්	47,500.00	47,500.00	-
194	ප්‍රාග්ධන වියදම්	300,000.00	299,973.25	26.75
194	ප්‍රාග්ධන වියදම්	4,619,830.00	4,582,530.00	37,300.00
194	ප්‍රාග්ධන වියදම්	350,000.00	289,513.00	60,487.00
194	තරුණ සවිබල ගැන්වීමේ වැඩසටහන	8,710,049.86	8,299,585.22	410,464.64
201	දහම් සරසවි ඩිප්ලෝමා	300,000.00	299,931.75	68.25
201	දහම් පාසල් සඳහා පහසුකම් සැපයීම	23,200.00	21,200.00	2,000.00
202	මුස්ලිම් ආගමික ස්ථානවලට පහසුකම් සැපයීම් හා සංවර්ධනය කිරීම.	10,000,000.00	7,962,398.84	2,037,601.16
210	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම	92,519.08	92,519.08	-
216	ප්‍රාග්ධන වියදම්	35,696.25	35,696.25	-
216	ප්‍රාග්ධන වියදම්	2,000,000.00	2,000,000.00	-
216	කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම	3,000,000.00	3,000,000.00	-
216	ප්‍රජා මූලික පුනරුජ්ජාපන වැඩසටහන	337,834.00	337,801.80	32.2
217	ප්‍රගති සමාලෝචන රැසිවීම්	1,213,600.00	1,181,589.00	32,011.00
217	විවිධ ආධාර ලබා දීම	1,120,500.00	1,120,500.00	-
252	කලාපභාර නිළධාරීන් වෙත ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය සඳහා ඉන්ධන	47,856,947.17	44,773,165.12	3,083,782.05
254	ප්‍රාග්ධන වියදම්	1,884,387.68	1,798,617.45	85,770.23

289	රත්නපුර දිස්ත්‍රික් කාර්යාලයේ රැස්වීම් ශාලාවේ ඉහල මහල ඉදිකිරීම සඳහා	14,389,000.00	12,721,873.57	1,667,126.43
289	විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීම	1,829,903.00	1,138,821.19	691,081.81
327	ඉඩම් පරිහරණ වෙනස්කම් හඳුනා ගැනීමේ සමීක්ෂණය සඳහා ගමන් වියදම් හා ඉන්ධන වියදම්	2,194,600.00	2,194,275.80	324.2
327	දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු	67,000.00	67,000.00	-
328	පරිගණක උපාංග මිල දී ගැනීම.	8,000.00	8,000.00	-
328	කාර්යාල උපකරණ	36,750.00	36,750.00	-
328	රැකියාපොළ වැඩසටහන්	685,650.00	671,180.00	14,470.00
328	ඩිජිටල් වෙළඳාම හා ව්‍යාවසායකත්වය වැඩසටහන සඳහා	87,000.00	84,900.00	2,100.00
මුළු එකතුව		**6,200,106,371.14**	**5,224,354,099.45**	**975,752,271.69**
*** පුනරාවර්තන වියදමේදී ප්‍රධාන වියදම් පමණක් ලැයිස්තු ගත කර ඇත.*				

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය -2024

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	**2023.12.31** දිනට සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව ශේෂය	**2023.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	මෙතෙක් ගිණුම්ගත නොකළ	වාර්තා කිරීමේ ප්‍රගතිය % වශයෙන්
9151	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	1,047,723	1,047,723		
9152	යන්ත්‍ර සහ උපකරණ	439,816	439,816		
9153	ඉඩම්	604,668	604,668		
9154	අස්පෘෂ්‍ය වත්කම්	-	-		
9155	ජෛව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	නොනිම් වැඩ	343,816	343,817		
9080	ලීසිං වත්කම්	-	-		
එකතුව		**2,436,023**	**2,436,024**		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. SGCG/RT/A/DSR-FA/SUM/02/2024/28 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 මැයි 23 දින

දිස්ත්‍රික් ලේකම්,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

රත්නපුර.

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

.....

යටෝක්ත වාර්තාව සහ විගණනයේදී පරීක්ෂා කර සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

එම්.ජී.මදරසිංහ

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

පිටපත 01 අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - කා.දැ.ස

පිටපත 02 ලේකම් - රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත්

සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - අ.කා.ස

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. SGCG/RT/A/DSR-FA/SUM/02/2024/2 | ඔබේ අංකය ඔබது இல. Your No.

දිනය திகதி Date 2025 මැයි 31 දින

දිස්ත්‍රික් ලේකම්

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 31 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත.එම නිසා,මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත.මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා

වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් කොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල් සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හා වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවධානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්තාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන් , වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. ආදායම්

2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලට අනුව සමාලෝචිත වර්ෂයේ වෙන්දේසි ආදායම රු.581,655ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස වෙන්දේසි ආදායම රු 374,000 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු 207,655 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

1.6.2 ආදායම් නොවන ලැබීම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව අග්‍රිම ලැබීම් වටිනාකම රු7,874,348,835 ක් වුවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව එම වටිනාකම රු 7,874,348,775 ක් වීමෙන් රු 60 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

1.6.3 පුනරාවර්තන වියදම්

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වැය විෂයයන් 4 ක ප්‍රතිපාදන ඉතිරිය, දෙපාර්තමේන්තු වැය ලෙජරය සමඟ සැසඳීමේදී රු.1,165,797 ක වෙනසක් පැවතිණි.

1.6.4 මූල්‍ය නොවන වත්කම්

උපයෝජන තත්වයේ පවතින රු. 343,815,632 ක් වටිනාකමැති දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල වත්කමක් ලෙස ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව නොනිමි වැඩ යටතේ ගිණුම් ගත කර තිබුණි.

1.6.5 ශුද්ධ වත්කම්/ ස්කන්ධය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 හි සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ තැන්පතු ගිණුම් ශේෂයන් එකතුව රු.257,940,243 ක් වුවද 278 ශීර්ෂයට අදාළව මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ තැන්පතු ගිණුම් ශේෂ වටිනාකම රු .257,739,304 ක් වීමෙන් රු.200, 939 ක වෙනසක් පැවතුණි.

1.6.6 තැන්පතු ගිණුම් ශේෂ

සමාලෝචිත වර්ෂය අවසානයේ දිස්ත්‍රික් ලේකම් උප කාර්යාලයේ සිඟෑස් මුද්‍රිත අනුව ඇප තැන්පත් ගිණුමේ ශේෂය රු.1,820,,973ක් හා ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රදවා ගැනීම් ගිණුමේ ශේෂය රු.11,248,971ක් වූ අතර එම ශේෂයන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ පොදු තැන්පතු ගිණුම තුළ පිළිවෙලින් රු.1,885,971ක් හා රු.11,183,973ක් ලෙස දැක්වීමෙන් තැන්පතු ගිණුම් දෙකෙහිම රු 64,998 ක සමාන වූ වෙනසක් ඇති වී තිබුණි.

1.6.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පෙර වසරේ මූල්‍ය ප්‍රකාශව වලට අදාළව විගණනයේදී නිරීක්ෂණය කරන ලද දේපළ පිරියත හා උපකරණ අගය රු. 10,101,641,809 ක නොසැසඳීම, සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරය මඟින් ගැලපුම් කර තිබුණද ඒ සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ඉඩම් ගොඩනැගිලි හා වාහන අයිතම 06 ට අදාළ රු . 929,535,172 ක වටිනාකමැති ශේෂ සනාත කර ගැනීමට අදාළ ප්‍රාග්ධනිත කළ පිරිවැය වටිනාකම හෝ තක්සේරු වටිනාකම ඇතුළත් මූලාශ්‍ර ලේඛන ඉදිරිපත් නොකෙරුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බඳ්ට හා ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාක්මක කර තිබුණු බව මා ප්‍රකාශ කරමි.

3. මූල්‍ය සමාලෝචනය .

3.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ ශීර්ෂ 278 සඳහා සැලසුම අනුව ඉල්ලුම් කල යුතු අග්‍රිමය හා ඉල්ලුම් කල අග්‍රිමය රු.මිලියන 2,047,269 කින් අඩු අගයක් ගෙන ඇති අතර ඉල්ලුම් කල අග්‍රිමයෙන් හා ලද අග්‍රිමය රු.මිලියන 2,070,510 ක ප්‍රමාණයක් අඩුව ලැබී තිබුණි.

3.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (ii) ට පටහැනිව, වැය විෂයයන් 13 ක ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිවීම් සියයට 22ත් - සියයට 70ත් අතර පරාසයක පැවැතිණි.

3.3 වත්කම් කළමනාකරණය

(අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 ක වූ රජයේ ගොඩනැඟිලි 84 ක් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක පැවති ට්‍රැක්ටර්,ලොරි හා බවුසර් ඇතුලු වාහන 07ක් වසර 4ත් -7 ත් අතර කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක රජයට අයත් ඉඩම් වල ඇති ග්‍රාම නිලධාරී කාර්යාල 81 ක භූමි මැනුම් කර නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පෙජරෝ රථය 2021 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර ඇති අතර මේ වන විටත් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩමෙහි ප්‍රමාණය අක්කර 01යි රූඩ් 01යි පර්චස් 24 ක් සහ සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය පිහිටි ඉඩමෙහි ප්‍රමාණය රූඩ් 01, පර්චස් 32 ක් වූ භූමි ප්‍රමාණයක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1ඡේදය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756(6) ප්‍රකාරව මුදල් වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණය ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 15 දිනට පෙර සිදු කළ යුතු වුවත් බලංගොඩ හා ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගේ ග්‍රාම නිලධාරී කාර්යාල වල සමීක්ෂණ කටයුතු 2024 ඔක්තෝබර් 16 දින වන විටත් සිදු කර නොතිබුණි.

(උ) ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව වත්කම් අයිතම 445 ක් තිබුණද වටිනාකම රු 110,617,330 ක් වූ වත්කම් අයිතම 82 ක් පමණක් සිග්නස් පරිගණක වැඩ සටහනට ඇතුළත් කර තිබුණි.

3.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 කට වෙනත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 48 කින් අවශ්‍යතා 94 ක් සඳහා ලබාදුන් රු. මිලියන 946.9 ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂ අවසානයේ රු.මිලියන 151.5 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එකී ඉතිරිවීම් මුළු ප්‍රතිපාදනවලින් සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ආ) අයගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය අදියර දෙකක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජාපාදක සමිති 02 ක් වෙත ලබාදී තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විට ඉන් එක් අදියරක් පමණක් ක්‍රියාත්මක වී තිබුණි. අනෙක් අදියර ඉටු කිරීමට නොහැකි වී තිබීම හේතුවෙන් රු. 2,500,000 ක ප්‍රතිපාදන ආපසු යැවීමට සිදු වී තිබුණි.

3.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්,

එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

(අ)	(i) මුදල් රෙගුලාසි 571	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක වර්ෂ 02 ඉක්ම වූ එකතුව රු. 2,604,482 ක තැන්පතු 27 ක් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 1647(අ)	ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉකුත් වර්ෂය වෙනුවෙන් වාහන උපකරණ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක වාහන 21 ක් වෙනුවෙන් 2024 වර්ෂය තුල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි.
(ඇ)	2008 පෙබරවාරි 06 දිනැති හා අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.4 මාර්ගෝපදේශය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් පුරවැසි ප්‍රඥප්තියේ සේවා යාවත්කාලීන කර නොතිබුණි.
(ඇ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන කළමනාකරණය අමාත්‍යාංශ චක්‍රලේඛය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් මගින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් 2024 අගෝස්තු 15 වන විටත් පිළියෙල කර නොතිබුණි.

3.7 අවිධිමත් ගණුදෙනු

මුදල් රෙගුලාසි 135 යටතේ 2024 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මුදල් පාලනය සම්බන්ධ බලතල පැවරීම ප්‍රකාරව රු.500,000 කට වැඩි වාහන අලුත්වැඩියා සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතු වුවත් වවුවර් අංක 347 මඟින් ගෙවීම් කල රු.908,750 ක අලුත්වැඩියාව සඳහා මුදල් රෙගුලාසි 137 අනුව අනුමත කිරීමේදී බලයක් නොමැතිව හා අලුත්වැඩියාව සම්බන්ධ මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශය නොමැතිව ගෙවීම සඳහා අනුමැතිය ලබා දී තිබූ අතර 2025 අප්‍රේල් 03 දින වන විට ඉහත මුදල නැවත පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

3.8 අත්තිකාරම් ගිණුම් කටයුතු

මිය ගොස් මාස 03 සිට මාස 36 ක් කල්ගත වී තිබුණු, ස්ථාන මාරු වී මාස 05 ක කාලයක් ගතවී තිබුණු , වැඩ තහනම් කළ අවසාන වාරිකය අයකර මාස 06 සිට අවුරුදු 12 දක්වා කිසිදු වාරිකයක් අය නොකළ හා විශ්‍රාම ගොස් මාස 03 සිට මාස12 ක් දක්වා කල් ගත වී තිබුණු ආදී ලෙස නිලධාරීන් 20 දෙනෙකුගෙන් රු.2.937,013 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවැතුණි.

3.9 බැංකු ගිණුම් මෙහෙයවීම

කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය හා මූල්‍ය ප්‍රකාශනය අනුව එදිනට එම කාර්යාලයේ ශේෂය අතර රු .5,000,000 ක වෙනසක් පැවතිණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කළ ඇස්තමේන්තුගත පිරිවැය රු.22,764,925 ක් වූ ව්‍යාපෘති 28 ක් නිම නොකර අතහැර දමා තිබුණි.

(ආ) ගම සමඟ පිළිසඳර වැඩ සටහන යටතේ 2023 වර්ෂයේ දී ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සේවා පියසක් ඉදිකිරීම සඳහා රු 1,199,947 ක ප්‍රතිපාදනයක් අනුමත වී තිබුණු අතර ඉන් රු 333,648 ක වැඩ ඉටුකර ව්‍යාපෘතිය අතරමඟ නවතා තිබුණි.

(ඇ) රත්නපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් 29ක ක්‍රිකට් සංවර්ධනය සඳහා පැති විකට් ඉදිකිරීමට හා ක්‍රීඩාපිටි සංවර්ධනය සඳහා වැය විෂයය අංක 194-2-7-009-2509 යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් රු.40,977,595 ක ප්‍රතිපාදන රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි.

I. පැති විකට් ඉදිකර තිබුණු පාසැල්වල කොන්ක්‍රීට් කර තිබුණු පිටිය වටා තණ පිඬලි ඇල්ලීම සඳහා එක් පාසලකට රු.30,000 බැගින් පාසල් 20 ක් සඳහා එකතුව රු.600,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, එම කාර්යය ඉටුකර නොතිබීම හේතුවෙන් කොන්ක්‍රීට් පිටිය වටා ඇතැම් ස්ථාන කැඩී තිබුණු අතර වැසි කාලවලදී කොන්ක්‍රීට් කර තිබුණු කොටස වටා ඇති පස් තට්ටු මඩ සහිත වී තිබුණි.

II. ර/හුණුවල ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිවරයාගෙන් පැති විකට් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අවශ්‍යතාවය පිළිබඳව කරුණු විමසීමක් සිදු නොකර ව්‍යාපෘතිය සඳහා පාසල තෝරා ගැනීමෙන් පසු පාසලේ පවතින ක්‍රීඩා පිටිය පැති විකට් ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව හා එය ඉදිකිරීමට පාසලේ වෙනත් ඉඩක් නොමැති නිසා එම ව්‍යාපෘතිය පාසලට අවශ්‍ය නොවන බව විදුහල්පතිවරයා විසින් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත දැනුම් දීමෙන් පසු ව්‍යාපෘතිය අවලංගු කර තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතිය සඳහා පාසල් තෝරා ගැනීමේදී පාසලේ අවශ්‍යතාවය පිළිබඳව හඳුනාගෙන නොතිබීම හේතුවෙන්, වෙනත් පාසලකට පැති විකට් ඉදිකිරීමට තිබුණු අවස්ථාව මහහැරී තිබුණි.

4.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක ව්‍යාපෘති 39 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 1980 වසරේ සිට 2023 වර්ෂය අතර කාලය තුළ ආරම්භ කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් අත්පත් කර ගැනීමේ කටයුතු නිම වී නොතිබුණි.

(ආ) රත්නපුර දිස්ත්‍රික්කයේ 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ වර්ෂයන්හි ගංවතුරින් හා නාය යාම් වලින් හානියට පත් මුළු නිවාස ගණන 26,572 ක් වූ අතර ලබා දිය යුතුව තිබූ මුළු වන්දි මුදල රු 1,106,840,660 ක් වුවද 2024 දෙසැම්බර් 31 වන විට ඉන් තවදුරටත් ලබා දිය යුතු වන්දි මුදල් රු 762,317,467 ක් ව පැවතුණි.

(ඇ) ගංවතුර හා නායයාම් නිසා හානියට පත් නිවාස වෙනුවෙන් එකතුව රු.83,990,000 ක වන්දි මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක ප්‍රතිලාභී පවුල් 104 ක් වෙත ලබාදී තිබුණද එම නිවාස අඩක් නිමකල තත්ත්වයේ පැවති අතර ප්‍රතිලාභී පවුල් අධි අවධානම් ස්ථාන වල හෝ වෙනත් තාවකාලික ස්ථානවල පදිංචිව ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ප්‍රතිලාභී පවුල් 10 ක් වෙත නායයෑම් අවදානම හේතුවෙන් නැවත පදිංචි කිරීම් සඳහා එකතුව රු.2,800,000 ක මුදලක් ලබාදී තිබුණද කිසිදු භෞතික ප්‍රගතියක් නිරීක්ෂණය නොවීය.

(ඉ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඉදිකිරීම් මාර්ගෝපදේශයෙහි පියවර 08 අනුව ආපදා ගම්මාන සඳහා යටිතල පහසුකම් වන ජලය,විදුලිය හා ප්‍රවේශ මාර්ග සම්පාදනය කල යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ආපදා ගම්මාන සඳහා ජල පහසුකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 01 ක ආපදා ගම්මාන සඳහා විදුලි පහසුකම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ආපදා ගම්මාන සඳහා ප්‍රවේශ මාර්ග පහසුකම් සම්පාදනය කර නොතිබුණි.

(ඊ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක 1997 – 2021 දක්වා කාලය තුළ ඉඩම් 183 ක් පමණ විවිධ රජයේ ආයතන විසින් පවරා ගැනීමට ඉල්ලුම් කර ඇතත් 2024 දෙසැම්බර් 31 වන විටත් අදාල කටයුතු අවසන් වී නොතිබුණි..

4.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

අනුකූලතා වාර්තාවේ අවශ්‍යතා 63 ක් වෙනුවෙන් අනුකූල වේ යනුවෙන් දක්වා තිබුණි. ඉන් අවශ්‍යතා 10 ක නියැදියක් පරීක්ෂා කිරීමේ දී අවශ්‍යතා 05 ක අනුකූල නොවීම් අනාවරණය වූ බැවින් ඉතිරි අවශ්‍යතා 53 වෙනුවෙන් ද මෙවැනි අක්‍රමවත් සටහන් තැබීම් පැවතිය හැකි බව නිරීක්ෂණය කෙරේ.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවිත්‍රතා සේවාව පවත්වාගෙන යාමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ (2006) වගන්ති අංක 5.2.1(අ) ප්‍රකාරව ලංසුකරුවෙකුට ප්‍රතිචාරාත්මක ලංසුවක් පිළියළ කිරීමට අවශ්‍ය සියලු තොරතුරු ඇතුළත් කිරීමෙන් තොර වීම මත පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය , සේවක අර්ධ සාධක අරමුදල හා ආයතනයේ ලාභාංශ වෙනම හඳුනා ගැනීමට නොහැකි වන පරිදි ලංසු කැඳවීම් සිදු කර තිබීමෙන් පවිත්‍රතා කටයුතු සඳහා වූ අමුද්‍රව්‍ය හා උපකරණ ප්‍රමාණාත්මකව හඳුනාගැනීම අපහසු වී තිබුණි.

(ආ) රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සමිති වෙත බෙදා හැරීම සඳහා ප්ලාස්ටික් පුටු 3,294 ක් මිලදී ගැනීම සඳහා රු 5,336,280 ක් වැය දරා තිබුණද ප්‍රසම්පාදනයේ දී අවශ්‍ය පුටු සංඛ්‍යාව සටහන් නොකර එක් පුටුවක් මිලට ගැනීම සඳහා මිල ගණනක් කැඳවීම තුළින් ප්‍රමාණාත්මකතාවය අනුව ලබාගත හැකිව තිබූ මූල්‍යමය වටිනාකම අහිමි වී තිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යයාල 03 ක 2024 වර්ෂයට අදාළ සනීපාරක්ෂක සේවා ලබා ගැනීම හා ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේදී පෙර වර්ෂ වල සිට මිල ඉදිරිපත් නොකරන ආයතන වෙත මෙම වසරේද මිල විමසීම් යැවීම සිදු කර තිබුණද එම ආයතන ප්‍රතිචාර නොදැක්වීම මත මිල ඉදිරිපත් කරන ආයතන එකක් හෝ දෙකක් පමණක් පදනම් කරගෙන උපරිම තරඟකාරී මිල විමසුමකින් තොරව ලංසුකරු තෝරීම කර තිබුණි.

(ඈ) මාර්ග කොන්ක්‍රීට් කිරීමට අදාළව රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාර්ග 05 ක ලොග් සටහන් වාර්තා අනුව මාර්ග කොන්ක්‍රීට් කළ දිනයන් හා තත්ත්ව වාර්තා අනුව කොන්ක්‍රීට් සාම්පල් ලබාගත් දිනයන් අතර වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් තත්ත්ව වාර්තා පිළිගත නොහැකි තත්ත්වයක පැවතුණි.

(ඉ) ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් කාවන්තිස්ස විහාර මාවත කොන්ක්‍රීට් කිරීමේදී මාර්ගයේ මීටර් 19.5 ක පමණ ප්‍රමාණයක දෙපැත්තේ පැති බැම්ම පෙරලීමේ අවදානමක් තිබියදී කොන්ක්‍රීට් කිරීම හේතුවෙන් එම කොටස සඳහා දරණ ලද රු 342,389 ක පිරිවැයට අදාලව මාර්ගයේ දිගුකාලීන පැවැත්ම අවිනිශ්චිතව තිබුණි.

4.3 පාඩු හා හානි

(අ) බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු රජයේ ඉඩම් තුල කළුගල් කැනීම සඳහා වාර්ෂික බදු පදනම මත ලබා දීමේදී 2009 මැයි 06 දින අංක 1600/18 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අනු අංක 01 අනුව වාර්ෂික කියුබ් ප්‍රමාණය අනුව අය කළ යුතු ගාස්තුව, ගල් කැනීම් ස්ථාන 14 කට අදාළව රු. 419,400,000 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හානි පාඩු ලේඛනයේ සඳහන් 2020 වර්ෂයේ සිට නොවිසඳී ඇති වාහන අනතුරු 04 ක් හා ගොඩනැගිලි ගිනි ගැනීම් සිද්ධි 01 ට අදාළව අලාභ වටිනාකම රු.4,463,504 ක් විය.

(ඇ) 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව, මියගිය විශ්‍රාමිකයින් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිසි පරිදි දැනුම් දීම ග්‍රාම නිලධාරීන් විසින් පැහැර හැරීම නිසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07 ක මියගිය විශ්‍රාමිකයින් 29 දෙනෙකු සඳහා රු. 1,900,399 ක් විශ්‍රාම වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක වූ විශ්‍රාමිකයින් සඳහා වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් වලින් 2024 දෙසැම්බර් 31 දින වන විට රු.10,006,332 ක් තවදුරටත් අයකර ගත යුතුව පැවැතිණි.

(ඉ) අඩු ආදායම් ලාභීන් වෙත නොමිලේ සහල් බෙදා දීමට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක් මඟින් සමානාත්මතා වෙළඳපොළ පැවති මිලට වඩා වැඩි මිලට සහල් මිලදී ගැනීම හේතුවෙන් රු .53,848,550 ක රජයට පාඩුවක් සිදු වී තිබුණි.

4.4 අනාර්ථික ගනුදෙනු

ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් කළු අදුර ප්‍රජා ශාලාවේ උළු සෙවිලි කළ වහලයේ රීප්ප දිරා පත් වීම හේතුවෙන් නැවත සැකසීම වෙනුවට රු.500,000ක ප්‍රතිපාදන මත වහලය අලුත්වැඩියා කර ඇස්බැස්ටෝස් සීට් යෙදීමේදී ඇස්බැස්ටෝස් තහඩු සඳහා අඩුවෙන් ඇස්තමේන්තු පිලියෙල කිරීම මත ඇස්බැස්ටෝස් සීට් ප්‍රමාණය අඩු කිරීම සඳහා අගුව කොටසේ වහලය අඩි 1.5 ක් කපා ඉවත් කිරීම මඟින් වර්ෂාවේදී බිත්ති තෙමීමට ලක්ව පැවතුණි.

4.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 හා අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2019 මාර්තු 23 දිනැති අංක 07/2019 දරණ චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක ඇප තැබිය යුතු නිලධාරීන් 24 දෙනෙක් විසින් අදාළ ඇප මුදල් තැන්පත් කර නොමැති බවත්, මුදල් රෙගුලාසි 881 (ii) සඳහන් විධිවිධාන ප්‍රකාරව එලෙස ඇප තැබීමට අවශ්‍ය සිය යටත් නිලධාරීන්ගෙන් නියමිත කාල සීමාව ඇතුළත ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි

4.6 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනහඩුව වසමේ බනිජ කැනීම සඳහා හෙක්ටයාර 94.6174ක භූමි ප්‍රමාණයක් පෞද්ගලික සමාගමකට ලබා දීමේදී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව

සිදු කළ යුතු සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් නොමැතිව, පුරාවිද්‍යාත්මක වටිනාකමැති ස්ථාන තිබියදී හදුනාගැනීමකින් තොරව හා බදු ගිවිසුමකට එලඹීමකින් තොරව වාර්ෂික බද්ද රු .6,504,000 ක මුදලක් අයකර 2022 සැප්තැම්බර් 12 දින භුක්තිය ලබා දීමට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කටයුතු කර තිබුණි.

4.7 කළමනාකරණ දුර්වලතා

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 ක 2018 හා 2019 වර්ෂවල ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ජීවනෝපාය සංවර්ධනය, ධාරිතා සංවර්ධනය හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ග්‍රාම ශක්ති ජනතා සමිති පිහිටුවා තිබුණු අතර ඒ සඳහා ලබා දී තිබුණු අරමුදලින් අක්‍රීය තත්ත්වයේ පවතින ග්‍රාම ශක්ති ජනතා සමිති 132 ක් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 132 ක රු .30,137,259 ක් වසර 04 ට අධික කාලයක සිට නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සක්‍රීය මට්ටමේ පවතින ග්‍රාම ශක්ති සමිති 03ක් විසින් සාමාජිකයින් 46 දෙනෙකුට ලබා දී තිබුණු වක්‍රීය ණය මුදලින් එකතුව රු. 334,391 ක් වූ ණය හා රු. 30,488 ක් වූ පොලිය හිඟව පැවතුණි.

(ඇ) ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2023 හා 2024 වර්ෂ වල බලපත්‍ර පසුපැවරුම් ඉල්ලුම් කල ප්‍රතිලාභීන් 46 දෙනෙකු සඳහා 2024 දෙසැම්බර් 11 දින වන විටත් බලපත්‍ර ලබා දී නොතිබුණි.

(ඇ) ඉඩම් කොමසාරිස්ගේ අංක 96/5 හා 1996.08.01 දිනැති චක්‍රලේඛයේ 6.11 ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 39,053,701 ක් වූ හිඟ දීර්ඝකාලීන බදු මුදල් යාවත් කාලීනව අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) නියඳිය සඳහා තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් යටතේ පවතින සමෘද්ධි ප්‍රජා මූල බැංකු 14 ක් මෙහෙයුම් කටයුතු වල නිරත වුවද එම ආයතන වාර්ෂිකව ස්වාධීන විගණනයකට ලක් නොවන බව නිරීක්ෂණය වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට මෙම බැංකු වල- සමස්ත වත්කම් රු. 24,105,088,895 ක්ද සමස්ත වගකීම් රු. 24,056,524,348 ක් සහ වර්ෂයේ ලාභය රු. 1,532,094,273 ක අගයක් ගෙන තිබුණි.

(ඊ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් ක්‍රියාත්මක වක්‍රීය ණය වැඩසටහන යටතේ ලබා දී ඇති ණය මුදල් වාරික 10 කින් ආපසු ගෙවා අවසන් කළ යුතු වුවත් අය්වීම් ප්‍රමාද වූ කාලය වර්ෂ 01 ත් -13 ත් අතර එකතුව රු. 545,364 ක හිඟ ණය ශේෂ පැවතුණි.

(උ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක සමෘද්ධි ණය ලබා දීම් වලට අදාළව ලබා දුන් ණය ප්‍රමාණය 2653 ක් සඳහා බොල් ණය ලෙස වෙන් කළ වටිනාකම රු. 185,274,355 ක් ව පැවතුණි.

(ඌ) රත්නපුර ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාසයේ අඩු ආදායම් ලාභීන් සඳහා සහල් බෙදා හැරීමේදී සමඟිපුර ග්‍රාමයේ එක් සහල් මිටියකින් සමිතියේ සාමාජික ගාස්තු සඳහා රු 120 බැගින් අය කිරීමක් සිදු කර තිබූ බව විගණනයට නිරීක්ෂණය වූ අතර සහල් බෙදා දීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මහ පෙන්වීම් හා අධීක්ෂණය ලබා නොදීම අනුක්‍රමිකතා සඳහා බලපා තිබුණි.

(එ) අඩු ආදායම් ලාභීන් සඳහා නොමිලේ සහල් බෙදා හැරීමට අදාලව 2024 අප්‍රේල් 04 දිනැති හා සමාජ සවිබල ගැන්වීම /01/2024 අංකිත වක්‍රලේඛයෙහි 02 වගන්තිය ප්‍රකාරව තෝරාගත යුතු ප්‍රතිලාභීන් නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රතිලාභීන් හැර ප්‍රාදේශීය ලේකම් විසින් සහල් ලබා දිය යුතු යැයි නිර්දේශ කිරීම සඳහා හඳුනාගත් ප්‍රතිලාභීන් 15,805 ක තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් සතුව නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විසි දෙවැනි (XXII) පරිච්ඡේදයේ 2.8 ඡේදය ප්‍රකාරව ආපනශාලාවක් (සුභසාධන සේවයක්) දෙපාර්තමේන්තු නිලධාරීන් මඟින් හෝ කොන්ත්‍රාත්තුවක් යටතේ පවත්වා ගෙන යා හැකි වුවත් කොන්ත්‍රාත් ක්‍රමයට ලබා දේ නම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කල යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක් මඟින් ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොමැති අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05කින් ආපනශාලාවෙන් ලබන මාසික ගාස්තු රජයේ ආදායමට බැර කර නොතිබුණි

5. තිරසාර සංවර්ධනය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිදු අභ්‍යන්තර වක්‍රලේඛය නිකුත් කිරීමක් ක්‍රියාකාරී සැලසුම් පිළියෙළ කර ගැනීමක් හෝ මගපෙන්වීමක් සිදු කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

6. යහ පාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

(අ) කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් දීමනා පත්‍ර 4 ක් ජනාධිපති විසින් අත්සන් කර වසර 1 ත් 5 ත් අතර කාලයක් ගත වුවද 2024 දෙසැම්බර් 20 දින වන විටත් බෙදා හැර නොතිබුණි. තවද ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කරන ලද බලපත්‍ර 29 ක් වසර 1 ත් 4 ත් අතර කාලයක් ගත වුවද බෙදා හැර නොතිබුණි.

(ආ) ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙත ජනාධිපති හා අගමැති කාර්යාලයෙන් 2024 මැයි 31 දිනෙන් පසුව ලද මහජන පැමිණිලි 10 ක් පොදු මහජන පැමිණිලි 09 ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලද පැමිණිලි 04 ක් ලේඛන ගත කිරීමෙන් තොරව 2024 අගෝස්තු 05 දින වන විටත් පැවැතුණු අතර එම මහජන පැමිණිලි විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

7. මානව සම්පත් කළමනාකරණය

7.1 අනුයුක්ත කාර්යය මණ්ඩලය, කථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද්විතියික මට්ටමට සේවක පුරප්පාඩු 313 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 481 ක් බව නිරීක්ෂණය වූ අතර එම සේවකයින් කළමණාකරණය කුලින් සේවක පුරප්පාඩු අවම කළ හැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

එම්.ජී.මදරසිංහ

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

04 - පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) - 2024

අනු අංකය	විශේෂිත දර්ශක	සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් වශයෙනි		
		100% - 90%	75% - 89%	50% - 74%
1	ආර්ථික වශයෙන් සවිබල ගන්වා ඇති පවුල් සංඛ්‍යාව	√		
2	අවසන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව	√		
3	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව			√
4	මුද්‍රණය කරන ලද පොත් සංඛ්‍යාව		√	

අනු අංකය	වැඩසටහන	සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් වශයෙනි		
		100% - 90%	75% - 89%	50% - 74%
1	විමධ්‍යගත අයවැය වැඩසටහන	92		
2	කඳුකර දශකය 2024 - 2033		85	
3	ග්‍රාමීය මාර්ග වැඩසටහන	100		
4	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන	100		
5	ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධන වැඩසටහන	100		
6	පිරිවෙන් සංවර්ධන වැඩසටහන	100		
7	පිරිවෙන් සංවර්ධන වැඩසටහන (ඩෙස් පුටු ලබා දීම)	100		
8	වතු යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන	100		
9	මුස්ලිම් පල්ලි සංවර්ධන වැඩසටහන		85	
10	පාසල් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන	100		
11	පාසල් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන (පැති විකට් ඉදිකිරීම)	100		
12	කිතුල් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන	100		
13	විදුලි වැට ඉදිකිරීමේ වැඩසටහන			25

05 - පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු - 2024 වර්ෂය

කි. වැ.අං	අරමුණ / ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා කාර්යසාධනයේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
01	දිළිදුකම තුරන් කිරීම	නිවාස පහසුකම් වැඩිදියුණු කිරීම-141 සුබසාධන ව්‍යාපෘති-1427 නිෂ්පාදන ගම්මාන සංවර්ධනය-08 ජීවනෝපාය සංවර්ධන කිරීම -92			√
02	තිරසර කෘෂිකර්ම ප්‍රවර්ධනය කිරීම	පැල කරන ලද කිතුල් පැල සංඛ්‍යාව -3000			√
04	සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම	වැඩිදියුණු කරන ලද පාසැල් -131 පාසැල් ක්‍රීඩාපිටි සහ පැති විකට් සංවර්ධනය කිරීම -26			√
06	පානීය ජල හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම	පානීය ජල ව්‍යාපෘති -40 සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම -57			√
09	සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම	මාර්ග සංවර්ධන -414 ආගමික ස්ථාන හා සුසාන භූමි සංවර්ධන -338 ග්‍රාමීය යටිතල පහසුකම් සංර්ධනය -168			√

5.2.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

❖ **ජයග්‍රහණ :**

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඉහත ජයග්‍රහණ දර්ශක සපුරාලමින් ව්‍යාපෘති වල අපේක්ෂිත ඉලක්ක 90% ක ට වඩා සාර්ථකව අවසන් කිරීමට හැකි වීම.
- බහුමානික දරිද්‍රතාව අවම කිරීම හා අනෙකුත් සියළුම මානයන් ලභාකර ගනීම

❖ **අභියෝග :**

- මැතිවරණ සහිත වර්ෂයක් වීම.
- ස්වාභාවික ආපදා තත්වයන් - ගංවතුර -නායයාම් - සුළිසුලං -නියඟය
- විවිධ වෘත්තීය සමිති වැඩවර්ජන හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බාධාකාරී තත්වයන් ඇතිවීම තුල දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදු වීම
- මූල්‍ය හිඟය (අරමුදල්)/නිවැරදි දත්ත පද්ධති හිඟ වීම/ප්‍රජා,නීතිමය හා දේශපාලනික ජාල ගත සබඳතා පුළුල් වීම.
- ප්‍රාදේශීය,ජාතික, රාජ්‍ය,අන්තර් රාජ්‍ය, මට්ටමින් සංවිධාන හා සිවිල් සමාජ සහයෝගී හවුල්කාරිත්වය පුළුල් වීම

06 - පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ මට්ටම	98	80	18	
තෘතීය මට්ටම	46	36	10	
ද්විතීය මට්ටම	2021	2225	0	204
ප්‍රාථමික මට්ටම	193	186	7	0
වෙනත්(අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්)	0	0	0	0
එකතුව	**2358**	**2527**	**35**	**204**

අනු අංකය	තනතුර	සේවය	අනුමත තනතුරු සංඛ්‍යාව	වර්තමාන සංඛ්‍යාව	පුරප්පාඩු/අතිරික්ත
1	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති	SLAS	1	1	0
2	අතිරේක දිස්ත්‍රික් ලේකම්	SLAS	2	2	0
3	අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)	SLPS	1	1	0
4	ප්‍රධාන ගණකාධිකාරි	SLAcS	1	1	0
5	ප්‍රධාන අභ්‍යන්තර විගණක	SLAcS	1	1	0
6	සහකාර දිස්ත්‍රික් ලේකම්	SLAS	1	1	0
7	ප්‍රාදේශීය ලේකම්	SLAS	18	18	0
8	සහකාර ප්‍රාදේශීය ලේකම්	SLAS	18	14	4
9	නියෝ. අධ්‍යක්ෂ (ක්‍ර.ස.)	SLPS	21	14	7
10	සහකාර අධ්‍යක්ෂ(ක්‍රම සම්පාදන)	Supplemenry	14	9	5
11	ගණකාධිකාරි	SLAcS	19	17	2
12	දිස්ත්‍රික් ඉංජිනේරු	SLEngS	1	1	0
13	*අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්	RegS	18	11	7
	ජේ්යෂ්ඨ මට්ටම		**116**	**91**	**25**
1	පරිපාලන නිලධාරි	PMAS	19	19	0
2	පරිපාලන ග්‍රාම නිලධාරි		18	14	0
3	භාෂා පරිවර්තක	TS	9	3	6
4	තොරතුරු තාක්ෂණ සං. නිලධාරි	SLICTS	1	0	1
	තෘතියික මට්ටම		**47**	**36**	**7**
1	සංවර්ධන සම්බන්ධීකාරක	AS	17	16	1
2	සංවර්ධන ක්ෂේත්‍ර සහකාර	AS	26	19	7
3	සංවර්ධන සහකාර	AS	4	3	1
4	අයවැය සහකාර	AS	2	1	1
5	සංවර්ධන නිලධාරි (පැරණි)	AS	9	6	3
6	සංවර්ධන නිලධාරි (278)	DOS	146	622	-476
7	සංවර්ධන නිලධාරි (409)	DOS	462	371	91
8	සංවර්ධන නිලධාරි (130)	DOS	221	159	62
9	කාර්මික නිලධාරි (1මධ්‍යම රජය)	SLTS	36	15	21
10	සැළසුම් ශිල්පී	SLTS	1	0	1
11	රාජ්‍ය කළමණාකරණ සහකාර	PMAS	465	470	-5
12	ග්‍රාම නිලධාරි		575	508	67
13	තොරතුරු හා තාක්ෂණ සං. සහකාර	දෙපා.	20	15	5
14	කාර්මික සහකාර නිලධාරි	SLICTS	36	20	16
15	පිළිගැනීමේ නිලධාරි	Con.basis	1	0	1
	ද්විතියික මට්ටම		**2021**	**2225**	**-204**
1	රියදුරු	CDS	46	46	0
2	කාර්යාල කාර්ය සහයක	OES	139	140	-1
3	විදුලි කාර්මික/ ජලනල කාර්මික	දෙපා.	1	0	1
4	බංගලා භාරකරු හා අරක්කැමි	දෙපා.	1	0	1
5	සනීපාරක්ෂක කම්කරු	දෙපා.	0	0	0
6	මුරකරු	දෙපා.	5	0	5
	ප්‍රාථමික මට්ටම		**192**	**186**	**6**
එකතුව			**2376**	**2538**	**-166**

** අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් තනතුරු එකතු කර නොමැත.*

6.2 **මානව සම්පත් හිඟය හෝ අතිරික්තය ආයතනයේ කාර්ය සාධනයට බලපාන්නේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

<u>සේවක ඌණතාවය</u> -

- අදාළ අංශවලට අවශ්‍ය නිලධාරීන් ජ්‍යෙෂ්ඨ /තෘතීය/ ද්විතීය /ප්‍රාථමික / වු විවිධ මට්ටම් වලින් බලපෑම් කලහැකිය

<u>සේවක අතිරික්තය</u> -

- ආයතනයකට උපරිම ධාරිතාවයෙන් කටයුතු නොකිරීම
- කාලය නාස්ති වීම අභියෝගාත්මක කරුණකි.
- වෘත්තීය සමිති, කණ්ඩායම් ආදී වශයෙන් සංවිධානය වීමේ හැකියාවක් තිබීම හා එය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි සෘජුව බලපාන කරුණකි.

6.3 ආයතනයේ කාර්යසාධනය සඳහා පුහුණු පාඨමාලා දායක වීම

මානව සම්පත් සංවර්ධනය - (සියළුම දේශීය පුහුණු අවස්ථා)

අනු අංකය	පුහුණු වැඩසටහන්	පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන	**2024** ප්‍රතිපාදනය (රු.)	**2024.12.31** දිනට වියදම (රු.)	ප්‍රතිලාභීන් ගණන
1	දිස්ත්‍රික් ලේකම් කාර්යාල	8	1,500,000.00	704,590.00	300
2	ප්‍රාදේශීය ලේකම් කාර්යාල	57	3,000,000.00	1,692,508.68	3813
එකතුව		**65**	**4,500,000.00**	**2,397,098.68**	**4113**

07 - පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ අවශ්‍යතාව	අනුකූල වීමේ ප්‍රකාශය (අනුකූල වේ/ නොවේ)	අනුකූල නොවීම පිළිබඳ කෙටි කරුණු දැක්වීමක්	අනාගතයේදී කාර්ය ඉටු නොකිරීම වැලැක්වීමට යෝජනා කරන නිවැරදි කිරීමේ කටයුතු
1	**පහත මූල්‍ය ප්‍රකාශන/ ගිණුම් නියමිත දිනයේදී ඉදිරිපත් කර තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකිරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකිරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත් සහ ලේඛන පවත්වාගෙන යාම**			
2.1	රා.ප.ව. 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කරමින් පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල වැටුප් ලේඛනය/පුද්ගල වැටුප් පත් යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලු මාසික ගිණුම් සාරාංශ (CIGAS) සකස් කර නියමිත දිනට භාණ්ඩාගාරයට යවා තිබේ	අනුකූල වේ		
2.6	චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	බඩු වට්ටෝරු ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	කටයුතු කරමින් පවති		
2.10	ඇප ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උපපත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යය අභිනියෝජනය (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල අභිනියෝජනය කර ඇත.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල අභිනියෝජනය ආයතනය තුල සන්නිවේදනය වී තිබේ.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු අතරින් සිදු වන ආකාරයට බලතල අභිනියෝජනය කර ඇත.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ වැටුප් මෘදුකාංගය භාවිත කිරීමේදී ගණකාධිකාරිවරුන් විසින් පාලනයන් අනුගමනය කර ඇත.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත.	අනුකූල වේ		
4.3	වාරෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත	අනුකූල වේ		

4.4	වාර්ෂික ඇස්තමේන්තු සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) යවා ඇත	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය කලට වේලාවට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට යවා ඇත	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු විගණකාධිපති විසින් නියම කර ඇති කාලය තුල යවා ඇත.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2), DMA/1-2019 ප්‍රකාරව විගණකාධිපති විමසා වර්ෂය ආරම්භයේදීම අභ්‍යන්තර විගණන සැලැස්මක් සක්ස් කර ඇත.	අනුකූල වේ		
6.2	සියලු අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මසක් ඇතුලත පිළිතුරු සපයා තිබේ.	අනුකූල වේ		
6.3	සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
6.4	මු.රෙ. 134 (3) අනුව සියලු අභන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
7	විගණන සහ කළමනාකරණ කමිටුව			
7.1	කළමනාකරණ විගණන දෙපා. චක්‍රලේඛ 1-2019 ප්‍රකාර වර්ෂයක් තුළ අවම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පවත්වා ඇත.	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	වත්කම් මිලදී ගැනීම සහ විනාශ කිරීම පිළිබඳ කොරතුරු වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 ඡේද අංක 07 ප්‍රකාරව පාලක ජනරාල් නිලධාරියාට ඉදිරිපත් කර ඇත.	අනුකූල නොවන		
8.2	චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීමට සම්බනධීකරණ නිලධාරියෙක් පත්කර, එම නිලධාරියාගේ විස්තර එම චක්‍රලේඛයේ 13 ඡේදයේ දැන්වෙන පරිදි පාලනාධිකාරි කාර්යාලයට යැවීම	අනුකූල නොවන		
8.3	භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා අදාළ වාර්තා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 ප්‍රකාරව නියමිත දිනට ඉදිරිපත් කරන ලදී.	අනුකූල වේ		
8.4	භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරනය වූ අතිරික්ත සහ හිඟය සහ ඒ හා සම්බන්ධ නිර්දේශ, ක්‍රියාමාර්ග චක්‍රලේඛයේ දැක්වෙන නියමිත කාලය තුල සිදු කරන ලදී.	අනුකූල වේ		
8.5	මු.රෙ. 772 ප්‍රකාරව නුසුදුසු භාණ්ඩ විනාශ කර ඇත	අනුකූල වේ		
9	**රථවාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහනවල දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
9.2	භාවිතයට නුසුදුසු වාහන නුසුදුසු බවට තීරණය කර මාස 6කට නොඅඩු කාලයක් ඇතුලත විනාශ කර ඇත.	කටයුතු කරමින් පවති		
9.3	වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් ඇත.	කටයුතු කරමින් පවති		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 සහ 110 ප්‍රකාරව පියවර ගෙන ඇත.	අනුකූල වේ		
9.5	වාහනවල ඉන්ධන පරිභෝජනය 2016.12.29 දිනැති රා.ප.ව. 30/2016 3.1 ඡේදය අනුව නැවත පරීක්ෂණය කර ඇත.	කටයුතු කරමින් පවති		
9.6	ලීසිං වාහනවල ලීසිං කාලය අවසන් වූ පසුව පරම අයිතියට වාහන ලොග් පොත මාරු කර ඇත	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	බැංකු සැසඳුම් ප්‍රකාශනය සකස් කර සහතික කරවාගෙන නියමිත දිනදී විගණනය සඳහා සූදානම් කර ඇත.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂය තුල හෝ පෙර වර්ෂයේ සිට පැවත ආ අක්‍රිය ගිණුම් නිරවුල් කර ඇත.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශනයෙන් අනාවරණය වූ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇති අතර ඒවාට ගැලපීම් කර මාසයක් ඇතුලත් එම ශේෂ නිරවුල් කර ඇත.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදනඋපයෝගී කර ගැනීම**			
11.1	සීමා නොඉක්මවමින් වෙන් කර දුන් ප්‍රතිපාදන වැය කර ඇත	අනුකූල වේ		
11.2	බැරකම් මු.රෙ. 94(1) අනුව වර්ෂය අවසානයේ ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා නැත	අනුකූල වේ		
12	**රාජ්‍ය නිලධාරින්සඳහා අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවලට අනුකූල වේ	අනුකූල වේ		
12.2	අය වීමට ඇති ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර ඇත.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වඩා වැඩි කාලයක් තුල අය විය යුතු ණය ශේෂ නිරවුල් කර ඇත.	කටයුතු කරමින් පවති		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	ඉකුත් තැන්පත් ඉවත් කිරීම සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාර කටයුතු කර ඇත.	අනුකූල වේ		
13.2	පොදු තැන්පත් පාලන ගිණුම යාවත්කාලීනව පවත්වාගෙන ගොස් තිබේ.	අනුකූල වේ		
14	**අක්මුදල් ගිණුම**			
14.1	මුදල් පොතේ සමාලෝචිත වර්ෂාවසාන ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර ඇත	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය උප අක්මුදල් කාර්යය සම්පූර්ණ කර මාසයක් ඇතුලත නිරවුල් කර ඇත	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවමින් තත්කාර්ය උප අක්මුදල් නිකුත් කර ඇත.	අනුකූල වේ		
14.4	අක්මුදල් ගිණුමේ ශේෂය මාසිකව භාණ්ඩාගාර පොත් සමග සසඳා ඇත	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	ආදායමින් මුදල් ආපසු ගැනීම රෙගුලාසි ප්‍රකාරව සිදු කර තිබේ.	අනුකූල වේ		
15.2	රැස් කළ ආදායම් තැන්පත් ගිණුමට බැර නොකර සෘජුවම ආදායම් ගිණුමට බැර කර ඇත.	අනුකූල වේ		
15.3	හිඟ ආදායම් ලැබීම් මු.රෙ. 176 ප්‍රකාරව විගණකාධිපතිට යොමු කර ඇත.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	කාර්ය මන්ඩලයට ගෙවීම් අනුමත කාර්ය මණ්ඩලය තුල සිදු කර ඇත.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට ලිඛිත රාජකාරි ලැයිස්තු ලබා දී ඇත.	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා MSD වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
17	**මහජනයාට තොරතුරු ලබා දීම් සම්බන්ධ ප්‍රතිපාදන**			

17.1	තොරතුරු ලබාගැනීමේ අයිතිවාසිකම් පනත සහ නියෝගවලට අනුව තොරතුරු නිලධාරියෙක් පත් කර විධිමත් තොරතුරු ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ඇත.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු වෙබ් අඩවිය හෝ විකල්ප වැඩ ක්‍රියාමාර්ග හරහා මහජනතාවට ලබා දී ඇති අතර මෙම වෙබ් අඩවිය හෝ විකල්ප ක්‍රියාමාර්ග මගින් මහජන අධිකාරියට එරෙහිව මහජනතාවට චෝදනා කිරීමට / චෝදනා කිරීමට පහසුකම් සලසා තිබේද යන්න.	කටයුතු කරමින් පවති		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 8 සහ 10 වගන්ති ප්‍රකාරව අර්ධ වාර්ෂික සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර ඇත.	අනුකූල නොවන		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මත කිරීම**			
18.1	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 05/2008 සහ 05/2008(1) දරන චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක්/පුරවැසි සේවාදායක ප්‍රඥප්තියක් සකස් කර ආයතනය විසින් ක්‍රියාත්මක කර ඇත	අනුකූල වේ		
18.2	චක්‍රලේඛයේ 2.3 ඡේදයට අනුව පුරවැසි ප්‍රඥප්තිය / පුරවැසි සේවාදායකයාගේ ප්‍රඥප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා තක්සේරු කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර ඇත.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම් 02හි ආකෘතියෙන් මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇත.	අනුකූල වේ		
19.2	එකී මානව සම්පත් සැලැස්ම තුල කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු අවම පුහුණු අවස්ථා ලබා දී ඇත.	අනුකූල වේ		
19.3	ඉහත කී චක්‍රලේඛයේ ඇමුණුම් 01 ආකෘතිය මත පදනම්ව සමස්ථ කාර්ය මණ්ඩලයම සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර ඇත.	අනුකූල වේ		
19.4	ඉහත කී චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර වගකීම පවරා ඇත.	අනුකූල වේ		
20	**විගණන ඡේද සඳහා පිළිතුරු**			
20.1	පෙර වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේදවල දැක්වූ අඩුපාඩු නිවැරදි කර ඇත.	අනුකූල වේ		

ස්තුතියි!

• දිස්ත්‍රික් /ප්‍රාදේශීය පරිපාලන හා ආර්ථික ක්‍රියාකාරකම්

සංචාරක ප්‍රවර්ධනය

- රත්නපුර දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම

විශේෂයෙන් උඩවලව ජාතික වනෝද්‍යානය ආශ්‍රිතව සංචාරක කර්මාන්තය තව දුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා එම වනෝද්‍යානය අයත් වන රත්නපුර සහ මොණරාගල යන දිස්ත්‍රික්ක ඒකාබද්ධව යාන්ත්‍රණයක් සැකසීම/බෙලිහුල්ඔය සංචාරක ප්‍රදේශය සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කිරීමට තීරණය විය.

- ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය (රත්නපුර මැණික් කුළුන)

මෙම මැණික් කුළුන අදියර දෙකක් යටතේ ගොඩනැගීමට සැලසුම් සකස් කර තිබේ. එහි පළමු අදියර යටතේ රුපියල් ලක්ෂ 3650 ක් වැයකර පස් මහල් ගොඩනැගිල්ලක් ඉදි කර ඇත. මෙම කුළුනෙහි දෙවැනි අදියර ලෙස මහල් 14ක් ඉදිකෙරෙන අතර ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල රුපියල් ලක්ෂ 4500කි. මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අයත් අරමුදල් භාවිත කරන අතර මෙය අලෙවිකරුවන්ට සහ ගැනුම්කරුවන්ට එකම වහලක් යටට සම්බන්ධ වීමට හැකිවන පරිදි ඉදිකරන ලද ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානයකි.එමෙන්ම මෙම මධ්‍යස්ථානය ආසියාවේ මැණික් හා ස්වර්ණාභරණ අලෙවිය සඳහා ප්‍රමුඛතම විකුණුම් මධ්‍යස්ථාන වන බැංකොක් සහ හොංකොංහි මෙන් ස්වාධීන තත්ත්ව පරීක්ෂණ සේවා, රසායනාගාර සේවා සහ බැංකු සහ අපනයන සේවා ද සපයනු ඇත





පානීය ජලසැපයුම /විදුලිය

- රට පුරා ඇති ජල යෝජනා ක්‍රමවලින් මුළු ලංකාවේම 721742 ක් ජල සම්බන්ධතා ගෙන ජලය පරිභෝජනය කරනු ලබයි. මෙය සමස්ත ජල සම්බන්ධතාවලින් සියයට 12.36 ක් තරම් සැලකිය යුතු ප්‍රතිශතයකි. මින් රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් 126 000 ක පමණ ජල සම්බන්ධතා ලබා දී තිබීම විශේෂත්වයකි. මේ අතර රත්නපුර දිස්ත්‍රික්කය ගතහොත් සෑම මසකම 100 කට අධික නව ජල සම්බන්ධතා ලබා දීම ද සිදු කරනු ලබයි.රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩිගමුව, අරලියදැයන, වලදූර, මූකලන්හේන ප්‍රදේශවල පවුල් 100 කට පමණ මින් සෙත සැලසේ. තුංකම සුවදිවි ප්‍රජාජල ව්‍යාපෘතිය , ශ්‍රී සංඛ ප්‍රජාජල ව්‍යාපෘතිය, උල්ලිදුවාව ගිං නදී නම් තවත් ප්‍රජාජල ව්‍යාපෘතියක් ද ඇඹිලිපිටියේ ක්‍රියාත්මක වේ. එවකට නිවාස 1229 කට සැලසුම් කළ තුංකම සුවදිවි ප්‍රජාජල යෝජනා ක්‍රමය අද වන විට තුංකම, කුටිවිගල සහ හාගල යන ගම්වල සාමාජිකයන් 2780 ක පමණ පිරිසකට සෙත සලසයි. එහි ප්‍රතිලාභ ලබන පිරිස 10,000 ඉක්මවන බව ද පැවසේ. රජයේ ප්‍රතිපාදන සියයට 80 ක් යොදවමින් ප්‍රජාව ග්‍රාමීය සංවර්ධනයට දායක කර ගනිමින් සියයට 20 ක ප්‍රජා දායකත්වයක් ලබා ගැනීම ප්‍රජාජල යෝජනා ක්‍රමයේ මූලික ලක්ෂණයක් වේ. මේ අනුව එවකට රජයෙන් ලබාදුන් මුදලට අමතරව එක් ප්‍රතිලාභී නිවසකින් රුපියල් 4500ක් බැගින් ප්‍රජා මූල සංවිධානය විසින් ද මුදල් යෙදීම සිදු විය. එසේම ප්‍රතිලාභීන්ගෙන් දින 15ක ශ්‍රම දායකත්වය ලබා ගනිමින් මේ ජල සම්පාදන යෝජනා ක්‍රමයට ප්‍රජාව දායක වී ඇත. මේ අනුව ප්‍රජාජල යෝජනා ක්‍රමයක් වටා ගොඩනැගෙන ප්‍රජා මූල සංවිධානය ගමේ සංවර්ධනයට දායක වීම සම්බන්ධයෙන් හොඳ ආදර්ශයක් ලෙස අපට මෙම සුව දිවි ප්‍රජා මූල ව්‍යාපෘතිය සඳහන් කළ හැක.
- විදුලිය
    - සමනල වෙල්ල සිට රජවක හරහා මුල්ගම දක්වා -කි.මී.14
    - මුල්ගම පාර සිට නවනැලිය 10 කණුව දක්වා - කි.මී 7
    - නවනැලිය 10 කණුව සිට දුවිලි ඇල්ල දක්වා - කි.මී 16.8
    - දෙහිපිටිය ගම්මානය වටා - කි.මී 1.9

ග්‍රාමීය මාර්ග

- පාලින්ද නුවර දික්හේන මාර්ගයේ පුවක් දොළ මංසන්ධියේ සිට මැල්ලගහවිල දක්වා මාර්ග සංවර්ධනය
- කෙම්පනාවත්ත හා බඹරබොටුව යා කෙරෙන නාහිටිය කම්බි පාලම සංවර්ධනය





	• සංවර්ධන ව්‍යාපෘති සඳහා මැනුම් කටයුතු සිදු කිරීම කහංගම කැටලියන්පල්ල වසම   
වෙළඳපල සංවර්ධනය	• "ජයගමු ශ්‍රී ලංකා" දීප ව්‍යාප්ත ජංගම සේවයේ රත්නපුර දිස්ත්‍රික් Glocal Fair 2024 • **කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනයක් හා අලෙවි පොළ** - සමස්ත ශ්‍රම බලකායෙන් 35% ක් නියෝජනය කරන කාන්තාවන් පිරිසක් කුඩා ව්‍යාපාර හෝ ස්වයං රැකියාවල නිරතවෙයි • දුරෙක්කන්ද වසමේ ග්‍රාමශක්ති වැඩසටහන යටතේක්‍රියාත්මක සති පොළ • අලෙවි පොළ මීහිටිය වසම • **කහංගම වසම - උද්‍යාන කුඩ ප්‍රතිලාභීන් 20 දෙනෙකුට ලබා දීම සහ රත්නපුර - පානදුර ප්‍රධාන මාර්ගයේ දෙපස එම අළෙවි පොළ** මිනිස්බල සහ රැකි රක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය දායකත්වය සහ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් තුමියගේ මග පෙන්වීම මත 2024.08.02 දින "ප්‍රාදේශීය රැකියා පොළ" 
අධ්‍යාපනය	▪ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය සංවර්ධන හදිසි ආධාර ව්‍යාපෘති වැඩසටහන (ADB) යටතේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙත පාසල් උපකරණ ලබා දීමේ හා මානස නිරවුල් කිරීම උදෙසා විශේෂ අධ්‍යාපන ආයතන ඒකකවල අධ්‍යාපනය ලබන තෝරාගත් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් 43 දෙනෙකු සඳහා පාසල් උපකරණ බෙදා දී දේශනයක්ද පැවැත්විනි ▪ "මගෙන් පටන්ගමු ජයගමු ශ්‍රී ලංකා" ජංගම වැඩසටහන -11 වෙනි ජංගම සේවා වැඩසටහන රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 18 ම ආවරණය වන පරිදි ස්මාට් පංති කාමර 19 ක් ද විගමණික දරුවන් සඳහා ශිෂ්‍යත්ව 1279, ශ්‍රම වාසනා අරමුදල යටතේ පාසල් උපකරණ කට්ටල දස දහසකට වැඩි සංඛ්‍යාවක් ,විදේශගත වී පැමිණෙන අය සඳහා ස්වයං රැකියා ආධාර 857 ක්ද ලබා දීමේ අරමුණින් පාසල් දරු දැරියන් සඳහා පාසල් උපකරණ, ස්මාට් බෝඩ් ,තරුණ පිරිස් වෘත්තිය පුහුණු සඳහා යොමු කිරීම, වෘත්තිය මාර්ගෝපදේශ සේවා සැපයීම, ඊශ්‍රායල් රැකියා අවස්ථා සඳහා ලියාපදිංචි කිරීම, දෙස් විදෙස් රැකියා අවස්ථා ලබා ගැනීම මෙහිදී ලබා දීමට කටයුතු යොදා තිබුණි ▪ ළමා අයිතීන් හා ළමා ආරක්ෂාව තේමා කර ගනිමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් සිව්වන වරටත් සංවිධානය කරනු ලැබූ "සිතුවිලි සිත්තම් 2024 සමස්ත ලංකා චිත්‍ර,පෝස්ටර් සහ කාටුන් තරගාවලියේ දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහයකයින් සඳහා පදක්කම් හා සහතික පත්‍ර පිරිනැමීම ▪ දෙවන භාෂා දෙමළ පුහුණු පාඨමාලාවේ සහතික පත් ප්‍රදානය ▪ නවක ග්‍රාම නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන ▪ ළමා රක්ෂණය පිළිබඳ දේශනය හා රස චින්දන වැඩසටහන ▪ චිත්‍ර ප්‍රතිකාරය මගින් ආතති කළමනාකරණ වැඩසටහන සහ ආකල්ප සංවර්ධන වැඩසටහන ▪ චිත්‍ර ප්‍රතිකාරය මගින් ආතති කළමනාකරණ වැඩසටහන සහ ආකල්ප සංවර්ධන වැඩසටහන ▪ ඇහැලියගොඩ මිත්නාන ග්‍රාම නිලධාරී වසමේ ශ්‍රී මුවලින්දාරාම විහාරස්ථානයේදී ලෝක ළමා දින හා වැඩිහිටි දින වැඩසටහනට සමගාමීව ඇහැලියගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලීය සමෘද්ධි සමාජ සංවර්ධන වැඩසටහන යටතේ පාසල් දරුවන්ට පොත් බෙදා දීම වැඩිහිටියන් වෙනුවෙන් ත්‍යාග ලබාදීම-වැඩිහිටි හා ළමා සංස්කෘතික ප්‍රසංගය















සෞඛ්‍ය

- රත්නපුර දිස්ත්‍රික්කයේ ඩෙංගු මර්ධන විශේෂ වැඩසටහන
- බෝ නොවන රෝග හඳුනාගැනීමේ සායනය (රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) 2024.08.07එමෙන්ම මෙම සායනයට සමගාමීව රත්නපුර ප්‍රාදේශීය සභා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය විසින් සංවිධානය කරන ලද ආහාර හා පෝෂණය සම්බන්ධ ප්‍රදර්ශනයක්ද පැවැත්විණිබෝ නොවන රෝග හඳුනාගැනීමේ සායනය (රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) 2024.08.07එමෙන්ම මෙම සායනයට සමගාමීව රත්නපුර ප්‍රාදේශීය සභා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය විසින් සංවිධානය කරන ලද ආහාර හා පෝෂණය සම්බන්ධ ප්‍රදර්ශනයක්ද පැවැත්විණි






කෘෂිකර්ම සංවර්ධනය /වතු ආශ්‍රිත සංවර්ධනය	▪ අලුත් ගමක් අලුත් රටක් වැඩසටහන හා කෘෂිකාර්මික ජාතික වැඩසටහන් වලට සමගාමීව කෘෂිකර්ම සංවර්ධන නිලධාරීන් විසින් සංවිධානය කරන ලද තවාන් පුහුණු වැඩසටහනක් 2024.11.19 දින ඇරැපොල විද්‍යාලයේ දී පවත්වන ලදි. ▪ රත්නපුර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ජනගහනය 1,171,000 ට ආසන්න සංඛ්‍යාවක් වේ.හුදකලා වූ ඔවුන්ටම ආවේනික සමිජ,සංස්කෘතික,කොටසක් ලෙස විකාශනය වූ වැවිලි ප්‍රජාවට මූලික අයිතිවාසිකම විදීමට හිමි වූයේ ඉතා අල්ප ප්‍රමාණයකටය. ජාතික ආදායමට සුවිසාල දායකත්වයක් සපයනු ලබන මෙම සේවක ප්‍රජාව හා ඔවුන්ගේ යැපෙන්නන් සඳහා නිවාස,සෞඛ්‍ය,අධ්‍යාපන , සුභසාධන හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම වතු ආශ්‍රිත සංවර්ධනය තුළින් සිදු කරනු ලබයි.   
ආගමික හා සංස්කෘතික සංවර්ධනය	▪ 2024/2025 උතුම් ගෞතම ශ්‍රී පාද වන්දනා චාරය ආරම්භ කිරීමට ප්‍රථම සධාතුක කරඩුව සහ සමන් දේව ප්‍රතිමා වහන්සේ බැතිමතුන්ගේ පූජෝපහාරය ▪ රත්නපුර දිස්ත්‍රික්කයේ 2023 වසරේ සිසු නිපුණතා ඇගයීම - දහම් පාසැල් හා 01,02 හා 03 වන ස්ථාන ලබා ගත් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල තුනටද ශූරතා හා ත්‍යාග ප්‍රදානය ▪ තෙපොංගල් සැමරුම් උත්සවය ▪ රත්නපුර හා මඩකලපු දිස්ත්‍රික්ක දෙක අතර සංස්කෘතික හුවමාරු වැඩසටහනක් පැවැත්වීම    
ප්‍රජා සංවර්ධනය- ප්‍රජා ආරක්ෂණය	   ▪ “ සුපසන් නිවසක්“ නිර්මාණය කිරීමේ අරමුණින් ප්‍රජා ඵලදායී වැඩසටහන ▪ ආර්ථිකයට විදේශ විනිමය ලබා දෙන ප්‍රමුඛ කණ්ඩායමක් වන විගමනික ප්‍රජාව ඉලක්ක කොට එකී පවුල්වල මානසික , ආකල්පමය සහ සමාජීය වශයෙන් ධනාත්මක වෙනසක් ඇති කරමින් ඔවුන් උපයන ධනය වඩාත් ඵලදායීව,සකසුරුවම්කමින් යුක්තව යොදා ගැනීමට මෙම ප්‍රජා ඵලදායිතා වැඩසටහන සංවිධානය කෙරිනි ▪ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඩවිකන්ද ග්‍රාම නිලධාරී වසමේ හා කැගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 502.69 වන වර්ණගලවත්ත ප්‍රදේශය සංරක්ෂණය   





- උරුමය සින්නක්කර ඔප්පු (නිදහස් දීමනා පත්‍ර) ලක්ෂ 20 ක් ලබා දීමේ ජාතික වැඩසටහන.වැඩසටහන මගින් සිදුවන්නේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දී ඇති දීමනා පත්‍ර හා අවසර පත්‍ර (උදාහරණ - ස්වර්ණ භූමි, ජය භූමි, රන්බිම, ඉසුරු භූමි ආදී) හිමියන් වෙත සින්නක්කර ඔප්පු ලබා දීමයි.
- ඇහැළියගොඩ ප්‍ර.ලේ. විසින් සිදුකරනු ලැබූ හිසට වහලක් නොමැති පුද්ගලයන් ගණන් ගැනීමේ රාජකාරී කටයුතු
- වර්ණගලවත්ත පාරිසරික ආරක්ෂක ප්‍රදේශය පිළිබඳ හඳුන්වාදීමේ වැඩසටහන






ජීවනෝපාය සංවර්ධනය

- අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම
- බතික් තාක්ෂණික පුහුණු වැඩසටහන
- මහන මැෂින් අලුත් වැඩියා කිරීමේ වැඩ සටහන ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යවසායකයින් සඳහා, සිංගර් ආයතනයේ සම්පත් දායකත්වයෙන් සීතා හෝල්ඩින්ස් ආයතනයේ අනුග්‍රහයෙන් 2024/10/23 දින පවත්වන ලදි





- ජීවනෝපාය සංවර්ධනය යටතේ අස්වැසුම ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම - පවුල් 23,301 ක්
- සමාජ ආරක්ෂණ යටතේ 2024 වර්ෂයේ සිප්දොර ශිෂ්‍යත්ව ඉල්ලුම් කළ සියළු සිසුන් සඳහා වර්ෂය තුළ සියළු මුදල් ගෙවා අවසන් කිරීම.

ආපදා කළමනාකරණය

- රත්නපුර ආපදා තත්ත්වය හමුවේ ජන ජීවිතය කඩිනමින් යථාතත්ත්වයට පත්කිරීම සඳහා ඉන්දුනීසියානු තානාපතිනියගෙන් රත්නපුරට ගං වතුර ආධාර - දිස්ත්‍රික්කයේ විශේෂයෙන් කළු ගඟ, කුරු ගඟ, කුකුළේ ගඟ,
- ගලතුර ඔය, නිරිඇල්ල ගඟ යන ගංගා ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශවලට පැවති අධික වර්ෂාව හේතුවෙන් පවුල් 9,010 ක සාමාජිකයින් 33,668 ක් වෙත ආපදා තත්ත්වය බලපෑම් කර තිබුණි. මරණ 05 ක්ද ,නිවාස 564 කට ආපදා අර්ධ හානි සිදු වී ඇත. ප්‍රදේශීය ලේකම් කොට්ඨාස 15 ක, ග්‍රාම නිලධාරී වසම් 211 කින් විදුලිය බිඳ වැටීම්, මාර්ග අවහිරතා, පස් කණ්ඩි කඩා වැටීම්, පානීය ජල ගැටළු, ගස් කඩා වැටීම් ඇතුළු විවිධ ආපදා සිදුවීම් වාර්තා වී ඇත
- ප්‍රාදේශිය ආපදා කළමනාකරණ කමිටු රැස්වීම 2024





ග්‍රාමීය ආර්ථිකය	▪ දුරෙක්කන්ද - වැනිලා වගා ව්‍යාපෘතිය දුරෙක්කන්ද - වැනිලා වගා ව්‍යාපෘතිය දුරෙක්කන්ද වැනිලා වගා ව්‍යාපෘතිය ▪ අපනයන කේන්ද්‍රීය නිෂ්පාදන ආර්ථිකයක් බිහිකිරීමෙහිලා කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ව්‍යාවසාය සංවර්ධන අධිකාරිය මගින් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින්ගේ සන්නාම 500 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහනෙහි “ සුවිශේෂී වූ පාරිභෝගික ▪ සත්කාර සේවාවක් ” මැයෙන් රත්නපුර දිස්ත්‍රික් වැඩසටහන   
වෙනත්	▪ Zero Plastic Waste යනු ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය ශූන්‍ය (Zero) කිරීම නොව කසල ලෙස පරිසරයට එකතුවන ප්ලාස්ටික් ශූන්‍ය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම   ▪ (SAVE THE CHILDREN, CEYLON EMERALD WAY (PVT) LTD, COMMUNITY) එක්ව පාසැල් දරුවන්ට පෝෂණ ආහාර සහ ගංවතුර ආපදාවන්ගෙන් පීඩා වූවන්ට සහන සැලසීම   ▪ "නැකතට පැළයක්" ජාතික රුක් රෝපණ වැඩසටහන - 2024 ▪ ගජමන් අම්බලම (ගජමන්සල) ප්‍රතිසංස්කරණය කිරීම -(රුපියල් මිලියන 10) - රත්නපුර, පලාබද්දල රජමාවත ඔස්සේ උතුම් ගෞතම ශ්‍රී පාදස්ථානය කරුණා කිරීමේදී දියබෙත්ම ප්‍රදේශයේදී දැනට නටබුන්ව ඇති ගජමන් අම්බලම ප්‍රතිසංස්කරණය ▪ රත්නපුර පරිසර නීතිය පිළිබඳ පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව    ********